## ව්‍යවස්ථා සංශෝධන කා සඳහාද?,
## කුමක් සඳහාද?
## ජනතාව සඳහා නම් නොවේ:



# ව්‍යවස්ථා සංශෝධන
# මගෝඩි

**ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා සංශෝධන ඉතිහාසය**
**පිළිබඳ විග්‍රහයක්**

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කල්‍යානන්ද තිරාණාගම

# ජාතික සංවිධානවල කාර්යභාරය

තමාට කල්වේලා ඇතිව කියවා බලා අධ්‍යනය කිරීමට අවස්ථාවක් නොලැබුනු, එසේ අන්තිම මොහොතේ ගෙන එන, සංශෝධන වලට පක්ෂව ඡන්දය දීමෙන් වළකින ලෙස සියලු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිය යුතු ය.

මන්ත්‍රීවරුන්ගේ නොසැළකිලිමත්භාවය නිසා කාරක සභා අවස්ථාවේදී 13වැනි සංශෝධනය බලාත්මක කෙරෙන සංශෝධන කූඨ ලෙස ඇතුළත් කළහොත් ඒ මහා පාවාදීමට දායක වන කිසිවෙකුට ඉතිහාසයෙන් සමාවක් නොලැබෙන බවද ඔවුන්ට පෙන්වා දිය යුතුය. පනත් කෙටුම්පත සම්මත වීමට ඉඩහැර ඡන්දය නොදී සිටීමෙන් පමණක් එම පාපයෙන් ගැලවිය නොහැකි බවද අවධාරණය කළ යුතුය. බෙදුම්වාදයට එරෙහිව දිවි පිදූ 60000ක් තරුණයින්ගේ මෙන්ම 30000ක් රණවිරුවන්ගේ සහ අත පය ඇස් දන්දුන් අදත් ජීවත්වන එවැනිම විරුවන් පිරිසකගේ ශාපයෙන් ඔවුනට ගැලවිය නොහැකි බව ද ඒත්තු ගැන්විය යුතුය.

# ව්‍යවස්ථා සංශෝධන කා සඳහාද? කුමක් සඳහාද? ජනතාව සඳහා නම් නොවේ: ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා සංශෝධන මගෝඩි

ආණ්ඩුව 21 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට ලහි ලහියේ සූදානම් වෙයි. කෙටුම්පතක් කැබිනට් අනුමැතිය ඇතිව ගැසට් කිරීමෙන් පසුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ආණ්ඩුව කියන පරිදි මේ සංශෝධනය ගෙන එන්නේ ජනාධිපතිගේ විධායක බලතල සීමාකොට ඒ බලතල පාර්ලිමේන්තුවට ලබාදී, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ය. ජනතා පැතුම් සපුරාලීම සඳහා මෙන්ම ජනතාවගේ යහපත උදෙසා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා මේ ව්‍යවස්ථා සංශෝධන ගෙන එනවාය කියන කතාව පට්ට පල් බොරුවකි.

බ්‍රිතාන්‍ය පාලනයෙන් සම්පූර්ණයෙන් මිදී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කොට ජාතික ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ගෙන එන ලද 1972 ජනරජ ව්‍යවස්ථාව හැරුණු කොට, මෙතෙක් ගෙන එන ලද කිසිම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් රටේ හෝ ජනතාවගේ යහපත අරමුණු කරගෙන ගෙන එන ලද ඒවා නොවේ.

1978 ව්‍යවස්ථාවත් එයට මේ දක්වා ගෙනවිත් ඇති සංශෝධන සියල්ලත් එක පුද්ගලයකු අතේ බලතල සංකේන්ද්‍රණය කර ගැනීමත්, එක පක්ෂයක් අතේ බලය රඳවා ගැනීමත්, ඒ සඳහා තමාට අභියෝගයක් විය හැකි ප්‍රබල ප්‍රතිවාදීන් දේශපාලන පොර පිටියෙන් ඉවත් කර තැබීමත්, යම් යම් පුද්ගලයින්ට දඬුවම් කිරීමත්, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවට අහිමි කොට ජනතා පරමාධිපත්‍යය මංකොල්ල කෑමත්, මැතිවරණවලදී සහාය ලබා ගැනීම සඳහා සුළු ජාතික හා අන්තවාදී පක්ෂවලට දොළ පිදේනි දීමත්, බෙදුම්වාදීන්ට වාසිදායක වන පරිදි විධායක ජනාධිපති ක්‍රමය දුර්වල කිරීමත් සඳහා ගෙන එන ලද ඒවා මිස දූෂණයට හා නාස්තියට වැට බැඳ, ජාතික සම්පත් ආරක්ෂා කිරීම සඳහා, රටේ යහපත් පාලනයක් ඇති කිරීම සඳහා හෝ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ගෙන එන ලද ඒවා නොවන බව ඒ එකිනෙකේ පසුබිම විමසා බලන විට පැහැදිලිව පෙනේ.

## 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1977 ජූලි මහ මැතිවරණයෙන් බලයට පත් ජේ.ආර්.ගේ ආණ්ඩුව මෙම නව ව්‍යවස්ථාව සම්මත කළේ මූලික වශයෙන් අරමුණු 3 ක් ඉලක්ක කර ගෙන ය. (1) වසර පහෙන් පහට මහ මැතිවරණ මගින් ආණ්ඩු වෙනස් කිරීම වළක්වා දිගටම එකම ආණ්ඩුවක් පවත්වා ගෙන යාම පළමු ඉලක්කයයි. ඒ බව ජේ.ආර්ගේ ආණ්ඩුවේ මුදල් ඇමති රොනී ද මැල් ව්‍යවස්ථා විවාදයේදි පැහැදිලිව කියා තිබුණි. (2) විධායක ජනාධිපති ක්‍රමය තුළින් රටේ සියලු පාලන බලතල එක පුද්ගලයකු අතට ගෙන රජය මෙහෙයවීම දෙවන ඉලක්කයයි. (3) මැතිවරණ කොට්ඨාස ක්‍රමය නැතිකර තමාට කැමති මන්ත්‍රීවරයකු තෝරාපත් කරගැනීමේ අයිතිය ඡන්දදායකයාට අහිමි කොට ඒ වෙනුවට දිස්ත්‍රික් මනාප ක්‍රමය මගින් තේරෙන මන්ත්‍රිවරුන් ඡන්දදායකයාට වගකීමක් නැති පක්ෂ ලේකම්ගේ අතේ නැටවෙන රූකඩ බවට පත් කර ගැනීම තෙවන ඉලක්කයයි. මෙම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුව මගින් අනුමත කරන ලදදේ 1978 අගෝස්තු 31 වන දින ය. ඒ යටතේ ජේ.ආර්.ගේ විධායක ජනාධිපති ධුරය 1978 පෙබරවාරි 4 වන දින සිට ක්‍රියාත්මක වේ.

## 1 වන ව්‍යවස්ථා සංශෝධනය

නව ව්‍යවස්ථාව අනුමත කොට යන්තම් මාස තුනක් ගතවීමටත් පෙර 1978 නොවැම්බර් 20 වන දින මෙම 1 වන සංශෝධනය ගෙන එන ලද්දේ තමන් කැමති පාලකයකු තෝරා පත්කර ගැනීමේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය ජනතාව ගෙන් උදුරා ගැනීම සඳහා ය. ඉදිරියේ පැවැත්වෙන කවර හෝ මැතිවරණයකදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සමග තරග කොට ජයගත නොහැකි බව ජේ.ආර්. දැන සිටියේ ය. ජනාධිපති කොමිසමක් පත්කොට බොරු චෝදනා නඟා බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමට කටයුතු කරන ලද්දේ එහෙයිනි. මැතිණිය මේ කොමිසමේ තීරණයට එරෙහිව රිට් ආඥාවක් ඉල්ලා අභියාචනාධිකරණය වෙත ගියා ය. ජේ.ආර්.ගේ ම 1978 ව්‍යවස්ථාව අනුව රිට් ආඥාවක් නිකුත් කිරීමේ බලය තිබුණේ අභියාචනාධිකරණයට ය.

මේ සංශෝධනය මගින් සිදු කරන ලද්දේ යම් යම් කරුණු සම්බන්ධයෙන් රිට් ආඥාවක් නිකුත් කිරීමට අභියාචනාධිකරණයට තිබූ බලය එයට අහිමි කොට ඒ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම

ය. මේ සංශෝධනය කථානායක අත්සන් කොට අනුමත කර තිබුණේ 1978 නොවැම්බර් 20 වනදා ය. පනතක් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන්නේ කථානායක අත්සන් කරන ලද දින සිට ය. එහෙත් ඊට බොහෝ කලකට පෙර මැතිණිය අභියාචනාධිකරණය වෙත ගොස් තිබුණි. එය වැළැක්වීම සඳහා මේ සංශෝධනය 1978 සැප්තැම්බර් 7 වන දින සිට ආපස්සට බලපාන පරිදි ක්‍රියාත්මක වන ලෙස පනවා තිබුණි.

**2 වන ව්‍යවස්ථා සංශෝධනය**

නව ව්‍යවස්ථාව අනුමත කොට හය මසක් ගතවීමටත් පෙර 1979 පෙබරවාරි 26 වන දින අනුමත කර ඇති 2 වන සංශෝධනය ගෙන එන ලද්දේ ව්‍යවස්ථාවට අනුව පක්ෂ මාරුව නිසා සිදුවිය හැකි මන්ත්‍රී ධුරය අහිමිවීම වළක්වා දුර්වලව සිටි විපක්ෂය තව දුරටත් දුර්වල කිරීම ඉලක්ක කර ගෙන ය. ඒ අනුව ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂයට ගියොත් මන්ත්‍රී ධුරය අහිමි වන අතර විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට ආවොත් මන්ත්‍රී ධුරය ආරක්ෂා කර දිය හැකි වේ.

- 1977 මහ මැතිවරණයෙන් ජේ. ආර්. ට හයෙන් පහක බලයක් (ආසන 168 න් 140 ක්) ලැබී තිබුණ අතර මැතිණියගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැබී තිබුණේ ආසන 8 ක් පමණකි. ඉන් එක් අයෙකු වූ බේරුවල මන්ත්‍රී ආර්. ජී. සමරනායක මාස කීපයකට පසු ආණ්ඩුවට එකතු විය.

- 78 ව්‍යවස්ථාවේ 161 (ඈ)(**ii**) වගන්තිය අනුව පක්ෂය හැර ගිය හෝ පක්ෂයෙන් පහ කළ මන්ත්‍රීවරයකුගේ අසුන හිස්වන අතර ඔහු වෙනුවට මන්ත්‍රී ධුරය සඳහා වෙනත් පක්ෂ සාමාජිකයකු නම් කිරීමට පක්ෂයට හැකිය. මන්ත්‍රී ධුරයෙන් පහකිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට ඒ මන්ත්‍රීවරයාට හැකිය.

- මේ සංශෝධනය අනුව පක්ෂයෙන් පහ කිරීම නිසා ඔහුගේ අසුන හිස් නොවන අතර එය 78 ව්‍යවස්ථාව පැනවූ දිනය දක්වා ආපස්සට බල පවත්වයි.

- මේ සංශෝධනය අනුව මන්ත්‍රීවරයකු පක්ෂයෙන් පහ කිරීමේ

නිවේදනය ලද වහාම කථානායකවරයා ඒ ගැන විභාග කිරීමට මන්ත්‍රීවරුන් 5 දෙනෙකුට නොඅඩු විශේෂ කාරක සභාවක් පත් කොට එහි වාර්තාව සලකා බලා මන්ත්‍රීවරුන් 85 දෙනෙකුට වැඩි පිරිසකගේ ඡන්දයෙන් යෝජනාවක් සම්මත කොට ඒ මන්ත්‍රීවරයාගේ මන්ත්‍රීධුරය අවසන් කළ හැකිය.

- ඒ අනුව ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂයට යන අයගේ මන්ත්‍රී ධුරය අහිමි වන අතර විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට එන අයගේ මන්ත්‍රී ධුරය ආරක්ෂා වෙයි.

**3 වන ව්‍යවස්ථා සංශෝධනය**

මේ සංශෝධනය ගෙන එන ලද්දේ සිය ධුර කාලය සම්පූර්ණවීමට පෙර ප්‍රතිවාදියා දුර්වල අවස්ථාවේ වසර 4 කට පසු හදිසි ජනපතිවරණයක් පවත්වා එය දිනා ගැනීමට අවස්ථාව සලසා ගැනීම සඳහා ය.

- ව්‍යවස්ථාව අනුව වසර 6කේ වන ජේ. ආර්.ගේ පළමු ජනපති ධුර කාලය අවසන් වීමට නියමිතව තිබුණේ 1984 පෙබරවාරි 4 වන දින ය. 1983 දෙසැම්බර් 4 වන තුරු මැතිවරණ කොමසාරිස්ට ජනපතිවරණයක් කැඳවිය නොහැක.

- 1983 අගෝස්තු 4 වන දිනට පාර්ලිමේන්තුවේ කාලය අවසන් වන අතර ඊට පෙර පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්විය යුතු ය. මහ මැතිවරණයකදී ආණ්ඩුවට හයෙන් පහක් තබා සාමාන්‍ය බහුතරයක් වත් ලබාගත හැකිවේදැයි යන්න අඩමාන ය. ඒනිසා මහ මැතිවරණයට පසු ජනපතිවරණය පැවැත්වීම අවදානම් හෙයින් ඊට පෙර ජනපතිවරණය පැවැත්වීම ආණ්ඩුවට වඩා වාසිදායක ය.

- මැතිණියගේ ප්‍රජා අයිතිය අහිමි කිරීම නිසා විපක්ෂයට හරිහමන් නායකත්වයක් නැත. ඔවුන් දුර්වල සහ අසංවිධානාත්මක ය. ජනපතිවරණය සඳහා ඔවුහු 1984 වන තුරු බලා සිටිති. ඒනිසා ඔවුන් බලපොරොත්තු නොවන මොහොතක හදිසියේ ජනපතිවරණය පවත්වා එය දිනා ගැනීම සඳහා 1982 අගෝස්තු 27 වන දින ජේ.ආර්. 3 වන සංශෝධනය ගෙන ආවේ ය.

## 4 වන ව්‍යවස්ථා සංශෝධනය

වසර 5 කට හෝ 6 කට වරක් පැවැත්වෙන මහ මැතිවරණයකදී තමන් කැමති ආණ්ඩුවක් තෝරා පත්කර ගැනීමට ජනතාව සතු ප්‍රජාතන්ත්‍රීය අයිතිය මංකොල්ල කමින් පාර්ලිමේන්තුවේ කාලය 1989 අගෝස්තු 4 වන දින දක්වා වසර 6 කින් දික් කර ගැනීම සඳහා ජනපතිවරණය පවත්වා මසකට පසු 1982 දෙසැම්බර් 23 දින මෙම සංශෝධනය ගෙන එන ලදී.

- විපක්ෂය බෙදී දුර්වලව පැවති අවස්ථාවේ 1982 නොවැම්බර් 20 වන දින 3වන සංශෝධනය අනුව පවත්වන ලද පළමු ජනපතිවරණයට විපක්ෂයෙන් අපේක්ෂකයන් 5 දෙනෙක් -හෙක්ටර් කොබ්බෑකඩුව, රෝහණ විජේවීර, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා, වාසුදේව නානායක්කාර සහ කුමාර් පොන්නම්බලම් ජේ.ආර්. ට එරෙහිව තරඟ කළහ. ප්‍රජා අයිතිය අහිමිව සිටීම නිසා බණ්ඩාරනායක මැතිණියට සිය පක්ෂ අපේක්ෂකයා වෙනුවෙන් ජනතාව ඇමතීමට නොහැකි විය. විපක්ෂයේ දුර්වලකමෙන් හා අසමගියෙන් ප්‍රයෝජන ගෙන රාජ්‍ය බලය යොදාගෙන ජනපතිවරණය යන්තම් දිනා ගැනීමට ජේ. ආර්ට හැකි විය.

- සියලු විපක්ෂ කණ්ඩායම් සමගිව තනි අපේක්ෂකයකු ඉදිරිපත් කළේ නම් ප්‍රතිඵලය ඊට වෙනස් වන්නට බොහෝ දුරට ඉඩ තිබුණි.

- 1983 අගෝස්තු 4 වන දින පාර්ලිමේන්තුවේ කාලය අවසන් වන හෙයින් මාස නවයකින් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්විය යුතු වේ. විපක්ෂ කණ්ඩායම් සමගි වුවත් නැතත් දිස්ත්‍රික් අනුපාත ක්‍රමය යටතේ පැවැත්වෙන මහ මැතිවරණයේදී ආණ්ඩුවට භයෙන් පහක් තබා සාමාන්‍ය බහුතරයක් වත් ලබා ගැනීමට හැකිවේද යන්න සැක සහිත ය.

- පාර්ලිමේන්තු බලය නැතුව ගියොත් තම සැලසුම් ක්‍රියාත්මක කළ නොහැකි වනු ඇත. ජනපතිවරණය දිනීම තේරුමක් නැති දෙයක් බවට පත්වනු ඇත. පාර්ලිමේන්තු බලය දිගටම පවත්වා ගත හැක්කේ මැතිවරණය නොපවත්වා පාර්ලිමේන්තුවේ කාලය දිගු කර ගැනීමෙන් පමණකි. 4 වන

සංශෝධනය ගෙන එන ලද්දේ ඒ සඳහා ය.
පාර්ලිමේන්තුවේ කාලය දික් කරන මේ සංශෝධනය සම්මත කළ හැක්කේ ජනමත විචාරණයක් මගින් ජනතා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණකි.

- 1982 දෙසැම්බර් මස 22 දින ලාම්පු කළගෙඩි සෙල්ලම නමින් හැඳින්වුණු ජනමත විචාරණය පවත්වන ලද්දේ ඒ සඳහා ය. නොයෙකුත් තර්ජන ගර්ජන හොර ඡන්ද දැමීම් ආදී අක්‍රමිකතා මගින් ජනමත විචාරණය දිනා ගැනීමට ආණ්ඩුව සමත් විය. ජනමත විචාරණයේදී හොර ඡන්ද දැමීමට ගොස් අසු වූ දස දහස් ගණනකට විරුද්ධව නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව මගින් චෝදනා පත්‍ර සකස් කර තිබූ බවත් ජනපතිගේ නියෝගය පිට නඩු පැවරීමේ අදහස අතහැර දැමූ බවත් නීතිපති දෙපාර්තමේන්තුව පැත්තෙන් ඒ දිනවල අසන්නට ලැබුණි.

## 5 වන ව්‍යවස්ථා සංශෝධනය

පාර්ලිමේන්තුවේ කාලය දික් කිරීම සඳහා පවත්වන ලද ජනමත විචාරණයේදී ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් නියෝජනය කළ ආසන 18 ක් පරාද විය. මේ 18 න් 12 ක් ම තිබුණේ දකුණු පලාතේ ය. මේ සංශෝධනය ගෙන එන ලද්දේ ඒ ජනමත විචාරණයේදී සිය ආසන දිනාගත නොහැකි වූ ඒ යූ.ඇන්.පී. මන්ත්‍රීවරුන් 18 දෙනාට නැවත අතුරු මැතිවරණයකට මුහුණ දීමට සිදු කිරීමෙන් ඔවුනට දඬුවම් කිරීම සඳහා ය.

- 1983 පෙබරවාරි 25 දින ගෙනඑන ලද මේ සංශෝධනය මගින් යම් ආසනයක පක්ෂයෙන් ඉවත් කළ මන්ත්‍රීවරයකු වෙනුවට වෙනත් අයකු නම් කළ බව නියමිත කාලය තුළ මැතිවරණ කොමසාරිස් වෙත පක්ෂ ලේකම් දන්වා යවා නොමැති නම් ඒ ආසනය සඳහා අතුරු මැතිවරණයක් පවත්වන ලෙස මැතිවරණ කොමසාරිස් වෙත ගැසට් නිවේදනයක් මගින් නියම කිරීමට ජනාධිපතිට බලය ලබා දෙන ලදී.

- 1983 මැයි මස 18 වන දින පවත්වන ලද ඒ අතුරු මැතිවරණ වලදී ආසන 4 ක්, එනම් බද්දේගම, අක්මීමන, මහරගම හා මතුගම ආසන, දිනා ගැනීමට විපක්ෂයට හැකි විය. තවත්

ආසන 4 ක් එනම් මහර, කලුතර, අම්බලන්ගොඩ හා තංගල්ල, විපක්ෂයට දිනාගත නොහැකිව තිබුණේ අපේක්ෂකයන් දෙතුන් දෙනා බැගින් කුළල් කෑම නිසා ය. නො එසේ නම් ඒ ආසන 4 ද විපක්ෂයට දිනාගත හැකිව තිබුණි.

## 6 වන ව්‍යවස්ථා සංශෝධනය

1983 ඇති වූ කළු ජූලිය නිසා උත්සන්න වූ රට බෙදී යාමේ අනතුරට එරෙහිව ගත් පියවරක් වශයෙන් 1983 අගෝස්තු 8 වන දින අනුමත කරන ලද මෙම සංශෝධනය මගින් වෙනම රාජ්‍යයක් පිහිටුවීමට පක්ෂව කතා කිරීම, ආධාර අනුබල දීම ආදිය වසර 7 කට ප්‍රජා අයිතිය අහිමි වීමටත් චංචල නිශ්චල දේපොල රාජසන්තක කිරීමටත් හේතුවන වරදක් බවට පත් කරන ලදී.

- උතුරේ කොටි ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයකින් මියගිය හමුදා සෙබලුන් 13 දෙනාගේ සිරුරු කොළඹට ගෙනවුත් මිහිදන් කරන අවස්ථාවේදී රට පුරා දෙමළ ජනතාවගේ ගෙවල් හා කඩ මංකොල්ල කමින්, දෙමළ මිනිසුන් සොය සොයා මරා දමමින්, කුට්ටිමනි ඇතුළු වැලිකඩ හිරගෙදර සිටි දෙමළ හිරකරුවන් පිරිස මරා දමා රට අපකීර්තියට පත් කළ කළු ජූලිය සිදු කරන ලද්දේ සිංහල ජනතාව විසින් නොව යූඇන්පී මැරයින් විසිනි. බොහෝ තැන්වල සිංහල ජනතාව කළේ තමන්ට ද එල්ල වන තර්ජන නොතකා තම දෙමළ අසල්වැසියන් ආරක්ෂා කිරීම ය. ඔවුන්ට රැකවරණ දීම ය. වහාම හදිසි නීතිය පනවා මැරයින් අත් අඩංගුවට ගෙන කලබල මැඩ පැවැත්වීමට පියවර ගන්නවා වෙනුවට, ජේ ආර්. කළේ දින කිහිපයක් හදිසි නීතිය නොපනවා මැරයින්ට ඉඩ දී බලා සිටීම ය.

- එවක පාර්ලිමේන්තුවේ සිටි විපක්ෂයේ බහුතරය දෙමළ එක්සත් විමුක්ති පෙරමුණට අයත් මන්ත්‍රීවරුන් වූ අතර 1977 සිටම විපක්ෂ නායක වූයේ අමිර්තලිංගම් ය. කළු ජූලිය නිසා දකුණේ සිටි දෙමළ මිනිසුන් අති විශාල පිරිසක් උතුරට පලාගිය අතර ඉන් සෑහෙන පිරිසක් සරණාගතයින් වශයෙන් ඉන්දියාවටත් බටහිර රටවලටත් සංක්‍රමණය වූහ. කළු ජූලිය නිසා බෙදුම්වාදී ඉල්ලීම්වලට ලොකු දිරියක් ලැබුනු අතර දෙමළ දේශපාලන පක්ෂ නායකයෝ පාර්ලිමේන්තුව තුළත් පිටතත් ජාත්‍යන්තර වශයෙනුත් වෙනම රාජ්‍යයක් ඉල්ලා

විවෘතවම හඬ නඟන්නට වූහ.

- 6 වන සංශෝධනය ගෙන එන ලද්දේ මේ අභියෝගයට මුහුණ දීම සඳහා ය. ව්‍යවස්ථාවට අලුතෙන් ඇතුළු කළ 157අ වගන්තිය මගින් රට තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට පක්ෂව කතා කිරීම, දිරිදීම, ආධාර අනුබල දීම, මුදල් එකතු කිරීම හෝ යෙදවීම තහනම් වන අතර ඊට වරදකරු වන පුද්ගලයකුගේ ප්‍රජා අයිතිය වසර 7 කට අත්හිටු වේ. චංචල නිශ්චල දේපොල රාජසන්තක කෙරේ. මන්ත්‍රී ධුරයක් හෝ රජයේ තනතුරක් දරයි නම් එය අවසන්වේ. එවැනි පරමාර්ථ සහිත දේශපාලන පක්ෂ තහනම් කෙරේ. රටේ හා රජයේ කවර හෝ තනතුරක් දරන සෑම පුද්ගලයෙක්ම එම වගන්තියට ඇතුළත් කර ඇති දිවුරුම් ප්‍රකාශය අනුව රට බෙදීමට උදව් වන ආකාරයේ කිසිදු ක්‍රියාවක් නොකරන බවට දිවුරුම් දීම කළ යුතු වේ.

- නමුත් අදාළ වැරදි පිළිබඳව මහජන මැදිහත්වීම මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සෑහෙන්නේ නැති බව දැන් ප්‍රායෝගිකව ඔප්පු වී ඇත.

## 7 වන ව්‍යවස්ථා සංශෝධනය

මෙය ද කළු ජූලියේ ප්‍රතිඵලයකි. යාපනය දිස්ත්‍රික්කයේ කොටසක් වූ කිළිනොච්චිය වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් බවට පත්කොට රටේ පරිපාලන දිස්ත්‍රික්ක ගණන 24 සිට 25 දක්වා වැඩි කිරීමත් මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව තාවකාලිකව වැඩි කර ගැනීම පිණිස මහාධිකරණ කොමසාරිස්වරුන් පත් කිරීමත් සඳහා මේ සංශෝධනය 1983 ඔක්තෝබර් 4 වන දින ගෙන එන ලදී.

- කළු ජූලිය නිසා උන්හිටිතැන් අහිමිව දකුණේ සිට උතුරට පලාගිය දෙමළ ජනතාව නවාතැන් ගත්තේ කිළිනොච්චිය අවට ප්‍රදේශයේ ය. අවතැන්වූවන් නැවත පදිංචි කිරීමට අවශ්‍ය ඉඩම් හා ජලපහසුව තිබුණේද යාපනේ නොව කිළිනොච්චියේ ය. සෑහෙන දුරකින් පිහිටි යාපනේ සිට මේ කටයුතු මෙහෙයවීම දුෂ්කර වූ හෙයින් ගතයුතු සුදුසුම පියවර වූයේ කිළිනොච්චිය වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් බවට පත්කොට එහි සිට කටයුතු මෙහෙයවීමයි. මහාධිකරණයද ඒ සඳහා අවශ්‍යතාවයකි. නැතහොත් යාපනයට යාමට සිදුවේ.

- කෙසේ වෙතත් මෙම සංශෝධනය බෙදුම්වාදී මාර්ග සිතියමට අදාළ එක් සැතපුම් කණුවක් බව දැන් ඉතා පැහැදිලිය.

## 8 වන ව්‍යවස්ථා සංශෝධනය

ජ්‍යේෂ්ඨ (ජනාධිපති) නීතිඥයන් පත් කිරීමට අදාළ රීති සැකසීමට ශ්‍රේෂ්ඨාධිකරණයට තිබූ බලය අහෝසි කොට ජනාධිපති නීතිඥයන් පත් කිරීමේ බලය ජනාධිපති වෙත පවරා ගැනීම සහ ඊට පෙර පත්කර සිටි රාජ නීතිඥයන් හා ජ්‍යෙෂ්ඨ නීතිඥයන් සියලු දෙනා ජනාධිපති නීතිඥයන් ලෙස නම් කිරීම 1984 මාර්තු 6 දින ගෙන ආ මෙම සංශෝධනය මගින් සිදු කරන ලදී

- නීතිඥ වෘත්තියේ විශිෂ්ට කුසලතා පෙන්වමින් දිගු කලක් උසස් ලෙස සේවයේ නියැලෙන නීතිඥවරුන්ගේ සේවය අගයමින් ඔවුන් සම්මානයට ලක් කිරීම දිගු කලක සිට පැවත එන සම්ප්‍රදායකි. බ්‍රිතාන්‍ය පාලන සමයේදී ඔවුන් හැඳින්වුනේ රාජ නීතිඥයින් වශයෙනි. ඊට පසුව 1972 ව්‍යවස්ථාව යටතේ ජ්‍යේෂ්ඨ නීතිඥයන් වශයෙනි. නමුත් 1978 ව්‍යවස්ථාව යටතේ මුල් කාලයේදී එසේ වෙනම නමකින් පත් කිරීමක් සිදු නො වීය.

- 1978 ව්‍යවස්ථාවේ 136 (1)(උ) වගන්තියට අනුව ජ්‍යෙෂ්ඨ නීතිඥයන් පත් කිරීමට අදාළ රීති සැකසීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට තිබුණි. මේ සංශෝධනය මගින් ඒ බලය අහෝසිකර ඇත. දැන් ජනාධිපති නීතිඥයන් පත් කිරීමේදී ඒ ශ්‍රේෂ්ඨාධිකරණ රීති අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් නැත.ඒ අනුව සුදුසුකම් නැතත් දේශපාලන හිතවත්කම් මත තමාට රිසි පුද්ගලයකු පත්කළ හැක. ඒ මගින් නීතිඥයින්ගේ වෘත්තීමය පිළිගැනීම ජනාධිපතිගේ අනුකම්පාවට යටත් කරන ලද අතර අධිකරණ පද්ධතියට ද ඒ මගින් බලපෑමක් ඇතිවිය හැකිය.

## 9 වන ව්‍යවස්ථා සංශෝධනය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම් සඳහන් කරන ව්‍යවස්ථාවේ 91(1)(ඇ) වගන්තිය සංශෝධනය කිරීම සඳහා 1984 අගෝස්තු 24 වන දින ගෙන එන ලද මේ සංශෝධනයෙන්

කර ඇත්තේ පසු කාලයේ ඇතිවූ වැටුප් ඉහළ යාම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් වීමට සුදුසුකම් නොලබන රාජ්‍ය හා සංස්ථා නිලධාරී කාණ්ඩ 4 ක් ගැන සඳහන් කිරීම පමණකි. මෙම සංශෝධනය සාමාන්‍ය පරිපාලන අවශ්‍යතාවයකි.

## 10 වන ව්‍යවස්ථා සංශෝධනය

මහජන ආරක්ෂාවට අදාළ හදිසි නීති රෙගුලාසි පවත්වා ගෙන යාමට සීමාවන් පනවා තිබූ ව්‍යවස්ථාවේ 155 (8) හා (9) වගන්ති දෙක ඉවත් කිරීම සඳහා 1986 අගෝස්තු 6 වන දින මෙම සංශෝධනය ගෙනවුත් ඇත.

- මේ වගන්ති අනුව එක දිගට තුන් මසක් හෝ හය මසක කාලයක් තුළ දින අනූවක් හදිසි නීතිය ක්‍රියාත්මකව පැවතිය හොත්, ඊළඟ හය මාසය තුළ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතිය නැතිව නැවත හදිසි නීතිය ක්‍රියාත්මක කළ නොහැක. එසේ පනවනු ලබන හදිසි නීතියක් වලංගුව පවතින්නේ දින දහයක කාලයක් පමණි.

- එසේ අනුමත නොකළ හොත්, ඒ දින දහයෙන් පසු ඉදිරි තෙමස තුළ නැවත හදිසි නීතිය පැනවිය නොහැක.

- ජේ.ආර්ගේ පාලන සමය තුළ ගෙන එන ලද සියලු ව්‍යවස්ථා සංශෝධන අතුරෙන් රටේ පැවැත්මට යහපතක් සිදුවූ එකම සංශෝධනය මෙය විය හැක. මේ සංශෝධනය නිසා නොවන්නට කොටි ත්‍රස්තවාදය කිසිදා පරාජය කළ නොහැකි වන්නට ඉඩ තිබුණි.

## 11 වන ව්‍යවස්ථා සංශෝධනය

ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය ශ්‍රී ලංකා මහාධිකරණය බවට පත් කිරීම (111(1) වගන්තිය), මුළු දිවයිනට ම එක ෆිස්කල්වරයෙක් පත් කොට එවකට උසාවිවල සිටි ෆිස්කල්වරුන් නියෝජ්‍ය ෆිස්කල්වරුන් බවට පත් කිරීම (113අ වගන්තිය), සහ ඊට පෙර අභියාචනාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙකු ඉදිරියේ විභාග කළ යුතුව තිබූ මහාධිකරණ තීන්දුවලට එරෙහි අභියාචනා අභියාචනාධිකරණ විනිසුරුවරුන් දෙදෙනෙකු ඉදිරියේ විභාග කිරීමට ඉඩ සැලසීම (146(2) වගන්තිය)

මේ සංශෝධනය මගින් සිදුකර ඇත.

- ඉන්දු ලංකා සම්මුතිය අත්සන් කිරීමට මාස දෙකකට පෙර 1987 මැයි 6 වන දින ගෙන එන ලද මේ සංශෝධනය එදා පැවති කිසියම් නීතිමය අවශ්‍යතාවයක් උඩ ගෙන එන ලද සංශෝධනයක් නොව 13 වන සංශෝධනය ගෙන ඒමට පෙර ඉන්දියාව සමග සාකච්ඡා යන අතරතුර ඉදිරියේ ඇති කෙරෙන පලාත් සභා ක්‍රමය යටතේ පලාත්බද මහාධිකරණ ඇති කිරීම සඳහා ගෙනෙන ලද සංශෝධනයක් බව පෙනේ.

- ඒ අනුව එම සංශෝධනයද බෙදුම්වාදී මාර්ග සිතියමේ තවත් සැතපුම් කණුවක් ලෙස සැළකිය හැක. පලාත් සභා ඇති කිරීමට ඉඩ සලසන ඉන්දු - ලංකා සම්මුතිය අත්සන් කරන ලද්දේ ඉන් දෙමසකට පසු 1987 ජූලි මාසයේදී ය.

## 13 වන ව්‍යවස්ථා සංශෝධනය

ඉන්දු - ලංකා සම්මුතිය අත්සන් කර මාස 4 කට පසු 1987 නොවැම්බර් 14 වන දින මෙම සංශෝධනය ගෙන එන ලද්දේ ඒ සම්මුතිය අනුව පලාත් සභා පිහිටුවා උතුරු නැගෙනහිරට බලය බෙදා හැරීම සඳහා ය.

- 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් දෙමළ රාජ්‍යය භාෂාවක් බවටත්, ඉංග්‍රීසි රටේ සන්ධාන භාෂාව බවටත් පත් කොට බලය බෙදා හැරීම සඳහා පලාත් සභා පිහිටුවීමටත් විධිවිධාන සලස්වන ලදී. පලාත් සභා නිසා ඒකීය රාජ්‍යය අවසන් වී, උතුරු නැගෙනහිර පූර්ණ පෙඩරල් රාජ්‍යයක් බවට පත්වී, රට බෙදීයාමේ බිහිසුණු අනතුර නිරතුරුව මතු වෙමින් තිබේ.

- 13 වන ව්‍යවස්ථා සංශෝධන පනත විභාග කළ නව පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලේ විනිසුරුවරුන් හතර දෙනෙකුගේ මතය වූයේ මේ සංශෝධනය තුළින් ඒකීය රාජ්‍යය නැති වී මේ රටේ පූර්ණ පෙඩරල් පාලන ක්‍රමයක් ඇති වන බවත්, ඒ නිසා ජනමත විචාරණයකින් තොරව මේ පනත සම්මත කළ නොහැකි බවත් ය.

- විනිසුරු මඩුල්ලේ බහුතරයේ මතය වූයේ සිය අභිමතය පරිදි පලාත් ආණ්ඩුකාරවරුන් පත් කොට ඔවුන් මගින් පලාත් සභා සතු මූල්‍යය, පොලිස්, ඉඩම් හා ව්‍යවස්ථා සම්පාදන බලතල පාලනය කිරීම සඳහා ජනාධිපතිවරයා සතුවන විධායක බලය නිසා පලාත් සභා ක්‍රමය තුලින් මේ රටේ පූර්ණ පෙඩරල් පාලන ක්‍රමයක් ඇති වීම වැළකී ඇති බවත්, ඒ විධායක බලය නොමැතිනම් පලාත් සභා ක්‍රමය තුලින් මේ රටේ පූර්ණ පෙඩරල් පාලන ක්‍රමයක් ඇති වන බවත්, ඒ නිසා මේ පනත සම්මත කිරීමට ජනමත විචාරණයක් අවශ්‍ය නොවන බවත් ය.

## කාරක සභා අවස්ථාවේදී මන්ත්‍රීවරුන්ගේ ඇස් වසා කර තිබූ මහා ප්‍රෝඩාව

- ව්‍යවස්ථාවේ බලය බෙදා හැරීමට අදාළ වගන්තිය 4 වන වගන්තියයි. ජනතා පරමාධිපත්‍යයට අයත් පාලන බලතල ක්‍රියාත්මක කළ යුතු ආකාරය දැක්වෙන්නේ මේ වගන්තියේ යි. මේ වගන්තිය යටතට ගැනෙන සංශෝධනයක් ජනමත විචාරණයකින් තොරව සම්මත කළ හැකිද යන කාරණය සළකා බැලූ විනිසුරු මඩුල්ල එහි ඉතිහාසය විමසා බලමින් මෙසේ පැවසීය:

**"විශේෂයෙන් ආරක්ෂිත (ජනමත විචාරණයකින් තොරව සංශෝධනය කළ නොහැකි) වගන්ති ව්‍යවස්ථාව ප්‍රකාශිතව සඳහන් කරයි. 4 වන වගන්තිය ඒ වගන්ති වලින් එකක් නොවේ. 1978 ව්‍යවස්ථා සම්පාදක ඉතිහාසයෙන් පෙනෙන්නේ 4 වන වගන්තිය විශේෂයෙන් ආරක්ෂිත වගන්ති ලැයිස්තුවෙන් සිතාමතාම බැහැර කර ඇති බවයි. 1978. 6. 22 වන දින පළකර ඇති ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ වාර්තාවේ 9 වන ඡේදයෙන් අනාවරණය වන්නේ 1 - 4, 9, 10, 11, 30(2), 62(2) හා 83 වගන්ති ඊට ඇතුළත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කර ඇති බවයි. 1978. 7. 14 වන දින දරන ගැසට් පත්‍රයෙහි පළකර ඇති 1972 ව්‍යවස්ථාව ඉවත් කොට ගෙන ආ නව ව්‍යවස්ථා පනතෙහි ද 4 වන වගන්තිය විශේෂයෙන් ආරක්ෂිත වගන්ති ගණයට ගැනෙන වගන්තියක් ලෙස ඇතුළත් කර තිබේ. එහෙත් පනත සම්මත වීමෙන් පසු විශේෂයෙන් ආරක්ෂිත වගන්තියක් විය යුතු 4 වන වගන්තිය ඉවත් කර ඇත. මේ ඉවත් කිරීම, විශේෂයෙන්ම 6, 7 හා 8 වන වගන්ති අළුතෙන්**

**ඇතුළත් කර ඇති තත්වයක් තුළ, සිතාමතාම කර ඇති දෙයක් ලෙස පූර්වානුමාන කළ යුතු ය." -( 13 වන ව්‍යවස්ථා සංශෝධන නඩු තීන්දුව, 33-34 පිටු)"**

- ඉහත දැක්වූ පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වූයේ ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් නිර්දේශ කර ඇති ගැසට් පත්‍රයේ පළකර තිබූ ජනමත විචාරණයකින් තොරව සම්මත කළ නොහැකි විශේෂයෙන් ආරක්ෂිත වගන්ති ලැයිස්තුවට ඇතුළත් කර තිබූ 4 වන වගන්තිය එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සිතාමතාම සිදුකර ඇති දෙයක් බවයි. එසේ නම් එය සිදු වූයේ කෙසේද? එය සිදු කළේ කවුද?

- 1978 ව්‍යවස්ථාව සම්මත කළ දවසේ පාර්ලිමේන්තු විවාදයට අදාළ හැන්සාඩ් වාර්තා හදාරමින් ඒ ගැන විමසා බැලූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති ගැන විශාරද දැනුමක් ඇති ජ්‍යෙෂ්ඨ නිතිඥ නෙවිල් ලද්දුවහෙට්ටි මහතා කලකට පෙර පුවත්පතක පළ කළ ලිපියක එය සිදුවූ ආකාරය පැහැදිලි කර තිබුණි. කාරක සභා අවස්ථාවේදී පනතට ගෙන ආ සංශෝධන සිංහල භාෂාවෙන් කියවන ලද්දේ අගමැති ආර්. ප්‍රේමදාස මහතා විසිනි. ඉංග්‍රීසි භාෂාවෙන් කියවන ලද්දේ ජේ.ආර්ගේ ආණ්ඩුවේ අධිකරණ ඇමති වූ කල්කුඩා මන්ත්‍රී කේ. ඩබ්ලිව්. දේවනායගම් මහතා විසිනි. ප්‍රේමදාස මහතා සිංහල භාෂාවෙන් කියවූ ලැයිස්තුවට 4 වන වගන්තිය ඇතුළත්ව තිබුණි. එහෙත් දේවනායගම් මහතා ඉංග්‍රීසි භාෂාවෙන් කියවූ ලැයිස්තුවට එය ඇතුළත් නො වීය. කථානායක අනුමැතිය ලබා පනත එළිදකින විට සිංහල ඉංග්‍රීසි පිටපත් දෙකේම එය ඇතුළත් නොවීය.

- ඒ ආකාරයට 1978 ව්‍යවස්ථාව සම්මත කරන අවස්ථාවේ සිටම අගමැතිගේ පවා ඇස් වසා මන්ත්‍රීවරුන් අඳුරේ තබා ප්‍රෝඩාකාරී ලෙස කාරක සභා අවස්ථාවේදී බෙදුම්වාදීන්ට අවශ්‍ය සංශෝධනය රිංගවා ගෙන තිබුණි. පසු කාලයේදී ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනට සිය පෞද්ගලික අවශ්‍යතා මත විවිධ ව්‍යවස්ථා සංශෝධන පහසුවෙන් ගෙන ඒමට ද ඒ මගින් ඉඩසැළසුනි.

## 14 වන ව්‍යවස්ථා සංශෝධනය

ඉන්දිය ආණ්ඩුවේ බලපෑම මත ජේ.ආර් ගෙනආ 13 වන සංශෝධනය හැරුනු කල රටට ඉතාම හානිකර සහ ස්ථාවර පාලනයක් පවත්වාගෙන යා නොහැකිව රටේ පාලනය අවුල් ජාලයක් වීමට හේතු වූ මෙන්ම අන්තවාදී බලවේග පෝෂණය කළ ව්‍යවස්ථා සංශෝධන තුනක් වන  14, 15 හා 16 වන සංශෝධන ප්‍රේමදාසගේ ජනාධිපති සිහිනය සැබෑ කර ගැනීම සඳහා ගෙන එන ලද ව්‍යවස්ථා සංශෝධන ලෙස පැවතිය හැක.

- මේ 14 වන සංශෝධනය ගෙන එන ලද්දේ ආර්. ප්‍රේමදාස ජනාධිපති වීමට මාස හයකට පෙර එජාප නායකයින් ඝාතනය කෙරෙමින් තිබූ අවධියක ඔහු ජනාධිපතිවරණ අපේක්ෂකත්වය ලබා ගැනීමට පොරකමින් සිටි කාලයේ ය. මෙය ජේ.ආර්. ජයවර්ධන විසින් ගෙනෙන ලද සංශෝධනයක් නොවේ. තම අවසාන මාස කිහිපය තුළ ඔහුට මෙවැනි සංශෝධනයක් ගෙන ඒමට හේතුවක් නැත. මෙය ජනාධිපතිවරණයේදී සුළු ජන කොටස්වල සහාය ලබා ගැනීම සඳහා ප්‍රේමදාස විසින් ගෙනෙන ලද සංශෝධනයක් බවට සැකයක් නැත.

- 1988 මැයි 24 දින අනුමත කරන ලද මෙම සංශෝධනය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 196 සිට 225 දක්වා 29 කින් වැඩි කිරීම - (62(1) වගන්තිය), ඒ වැඩි කළ 29 දෙනා ජාතික ලැයිස්තුවෙන් පත් කිරීමට ඉඩ සැලසීම - (99අ වගන්තිය), සුළු ජන නියෝජනයට වඩා ඉඩ සැලසෙන පරිදි සුළු ජාතික වාර්ගික හෝ ආගමික පිරිස් ඒකරාශී වීමක් සහිත මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට වඩා තේරී පත්වන ලොකු දිස්ත්‍රික්ක මැතිවරණ කලාප වලට බෙදීම සහ ඒ සඳහා මේ සංශෝධනය ක්‍රියාත්මක වී සති දෙකක් ඇතුළත මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණ කොමිසමක් පත් කිරීම (96අ වගන්තිය), මෙන්ම අපේක්ෂකයන් තුන් දෙනෙකුට මනාපය පළ කිරීමේ හිමිකම ලබා දීම (99(2) වගන්තිය) සිදු කරන ලදී.

## 15 වන ව්‍යවස්ථා සංශෝධනය

මෙම සංශෝධනය මගින් සිදු කළ එක දෙයක් වූයේ 1988 මැයි මස 24 වන දින ගෙන ආ 14වන සංශෝධනය යටතේ සිදු කළ මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදා වෙන් කිරීම අවලංගු කිරීමයි.

- ඒ වන විට ඒ සංශෝධනය යටතේ විශාල මහජන මුදල් කන්දරාවක් වැය කොට මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණ කොමිසමක් පත් කොට එමගින් සුළු ජාතික වාර්ගික හෝ ආගමික පිරිස් ඒකරාශී වීමක් සහිත තෝරාගත් මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදා වෙන් කොට එම කලාප 1988 ජූලි මස 27 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කොට තිබුණි. එසේ බෙදන ලද කලාප සුළු ජාතික වාර්ගික හෝ ආගමික පිරිස් වල සතුටට හේතු නොවූ හෙයින් එම ගැසට් නිවේදනය මේ සංශෝධනය මගින් අවලංගු කරන ලදී.

- මෙ මගින් සිදු කළ දෙවන සංශෝධනය වූයේ පාර්ලිමේන්තු නියෝජනයක් ලබා ගැනීම හෝ ඇප රාජසන්තක නොවීම සඳහා පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ලබාගත යුතු අවම ඡන්ද ප්‍රමාණය සියයට 12 සිට සියයට 5 දක්වා (අටෙන් එකේ සිට විස්සෙන් එක දක්වා) අඩු කිරීමයි. - (99(6) වගන්තිය)

- 1931 දී මේ රටේ සර්වජන ඡන්ද ක්‍රමය ඇතිවූ දා සිට ඒ දක්වා පවත්වන ලද සියළු මැතිවරණ වලදී යම් කොට්ඨාශයක් සඳහා තරඟ කරන පක්ෂයක් හෝ අපේක්ෂකයකු ඇප රාජසන්තක නොවීම සඳහා ලබාගත යුතු අවම ඡන්ද ප්‍රමාණය වූයේ දෙන ලද මුළු ඡන්ද ප්‍රමාණයෙන් අටෙන් එකකි, එනම් 12.5%කි.
  1978 ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය යටතේ පාර්ලිමේන්තු නියෝජනයක් ලබා ගැනීම සඳහා පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ලබාගත යුතු අවම ඡන්ද ප්‍රමාණය ද දිස්ත්‍රික්කයේ දෙන ලද මුළු ඡන්ද ප්‍රමාණයෙන් අටෙන් එකකි. ජනපතිවරණයේදී බෙදුම්වාදී හා අන්තවාදී සුළු ජාතික පිරිස්වල සහාය ලබා ගැනීම සඳහා ඔවුන්ට දොළ පිදේනි දීමක් වශයෙන් ගෙන එන ලද මේ සංශෝධනය මගින් පාර්ලිමේන්තු නියෝජනයක් ලබා ගැනීම සඳහා ලබාගත යුතු අවම ඡන්ද ප්‍රමාණය අටෙන් එකේ සිට විස්සෙන් එක දක්වා අඩු කරන ලදී.
  මේ සංශෝධනය රටට ඉතා අහිතකර අනිෂ්ට ප්‍රතිඵල ගෙන දීමට හේතු විය. අෂ්රොෆ්, හකීම්, රිෂාඩ් බදියුදීන්, මනෝ ගනේෂන් වැනි අන්තවාදින්ට හා බෙදුම්වාදීන්ට පාර්ලිමේන්තුවට පැමිණ බලගතු ඇමති ධුර ලබාගෙන ආණ්ඩු නැටවීමට හැකි වූයේ මේ සංශෝධනය නිසා ය. මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ පුනරුත්ථාපන හා අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ඇමති

වූයේ ද මෛත්‍රීපාල - රනිල් යහපාලන ආණ්ඩුවේ කර්මාන්ත හා වාණිජ ඇමති වූයේ ද රිෂාඩ් බදියුදීන් ය. කර්මාන්ත හා වාණිජ ඇමති වශයෙන් රිෂාඩ්ගේ අමාත්‍යාංශයට ආයතන 46 ක් පවරා තිබුණි. යුද්ධය නිසා යාපනේ සිංහල පවුල් 25000 කට ද මඩකලපුවේ සිංහල පවුල් 25000 කට ද උන්හිටි තැන් අහිමිවී තිබුණි. ඉන් පවුල් 100 ක් වත් නැවත පදිංචි කිරීමක් සිදු නොවීය. රිෂාඩ් කළේ විල්පත්තුව කපා විනාශ කොට මුස්ලිම් ජනාවාස ඇති කිරීමත්, කර්මාන්ත හා වාණිජ ඇමති වශයෙන් මුස්ලිම් ජාවාරම්කරුවන් පෝෂණය කිරීමත්, පාස්කු ප්‍රහාරය සිදු කළ මුස්ලිම් අන්තවාදීන්ට පහසුකම් සැලසීමත් ය. 1993 බලයට පත් චන්ද්‍රිකා කුමාරණතුංග ආණ්ඩුවේ නාවුක, වරාය පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ඇමති වූයේ අෂ්රොෆ් ය. අෂ්රොෆ් කළේ ඉස්ලාම් අන්තවාදීන්ගේ බෙදුම්වාදී මාර්ග සිතියමට අනුව ඔලුවිල් වරාය හදා ගැනීම ය. 1993 බලයට පත් චන්ද්‍රිකා කුමාරණතුංග ආණ්ඩුවේ දේශීය හා ජාත්‍යන්තර වෙළඳ, වාණිජ, නාවුක හා මුස්ලිම් ආගමික කටයුතු ඇමති ද, 2010 මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ අධිකරණ ඇමති ද, යහපාලන ආණ්ඩුවේ නගර සංවර්ධන, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන ඇමති ද වූයේ හකීම් ය.

- මේ සංශෝධනය නිසා රට අස්ථාවර විය. මහ මැතිවරණයකින් පසු රටේ ස්ථාවර ආණ්ඩුවක් ඇතිකර ගැනීම දුෂ්කර විය. විශේෂ තත්වයන් යටතේ පවත්වන ලද 2010 හා 2020 මහ මැතිවරණ දෙක හැර, වෙනත් කිසිම (1989, 1993, 2000, 2001, 2004, 2015) මහ මැතිවරණයකදී දිනූ කිසිම පක්ෂයකට අන්තවාදී සුළු ජාතික පක්ෂවල සහාය නොමැතිව ආණ්ඩුවක් පිහිටුවා ගත නොහැකි විය. මේ නිසා ඩීල් දේශපාලනයට දොරටු විවෘත වූ අතර ආණ්ඩුව අත්අඩංගුවේ තබාගෙන තම අසාධාරණ අන්තවාදී ඉලක්ක දෙසට ගමන් කිරීමට සුළු ජාතික අන්තවාදී පක්ෂවලට හැකි විය.

- මේ සංශෝධනය මහ මැතිවරණ පැවැත්වීමේදී දැවැන්ත මහජන මුදල් නාස්තියකට තුඩු දුන්නාක් මෙන් ම, ඡන්දදායකයා අන්දුන් කරන මහා විකෘතියක් ද මැතිවරණ ක්‍රමයේ ඇති කළේ ය. මේ සංශෝධනයෙන් පසු නාමික දේශපාලන පක්ෂ රාශියක් අළුතෙන් ලියා පදිංචි කරන ලද අතර ස්වාධීන කණ්ඩායම් දුසිම් ගණනක් එක් එක් දිස්ත්‍රික්කයෙන් මැතිවරණයට

ඉදිරිපත් විය. මැතිවරණ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2010 මහ මැතිවරණයට පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් 336 ක් ඉදිරිපත්වී තිබුණි. ඒ අතර ලියා පදිංචි පක්ෂ 36 ක් ද ස්වාධීන කණ්ඩායම් 301 ක් ද විය. මේ කණ්ඩායම් 301 න් 236 ක් ම ලබා ගෙන තිබුණේ ඡන්ද 100 ට අඩුවෙනි. විකෘතියේ තරම පෙනෙන්නේ එක් එක් දිස්ත්‍රික්කයේ තත්වය දෙස බැලීමේදී ය. දිගාමඩුල්ලට, ලියාපදිංචි පක්ෂවලට අමතරව ස්වාධීන කණ්ඩායම් 48 ක් ද, මඩකලපුවට, කණ්ඩායම් 28 ක් ද, කලුතරට, කණ්ඩායම් 22 ක් ද, මහනුවරට, කණ්ඩායම් 17 ක් ද තරඟ කර තිබුණි. කණ්ඩායම් 10 කට වඩා තරඟ කළ තවත් දිස්ත්‍රික්ක 9 ක් තිබුණි. දිගාමඩුල්ලේ ඡන්ද පත්‍රිකාවේ දිග පිටු 10 ක් පමණ වූ බව වාර්තා විය.

- මෙම පනත මගින් සිදු කළ තෙවන සංශෝධනය වූයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් පත් කිරීමේදී සුළු ජන අනුපාතයට අනුව මන්ත්‍රීවරුන් තේරී පත්ව ඇද්දැයි සොයාබලා එසේ පත්ව නැති නම් සුළු ජන කොටස්වලින් මන්ත්‍රීවරුන් නම්කර එවන මෙන් පක්ෂ ලේකම්වරුන්ට දන්වා යැවීමේ වගකීම මැතිවරණ කොමිසමට පැවරීමයි. - (99අ(4) වගන්තිය)

## 16 වන ව්‍යවස්ථා සංශෝධනය

ජනාධිපතිවරණය ජය ගැනීම සඳහා ද්‍රවිඩ බෙදුම්වාදීන්ගේ හා මුස්ලිම් අන්තවාදීන්ගේ සහාය ලබා ගැනීම පිණිස ජනපතිවරණයට දින දෙකකට පෙර නීතිගත කළ මෙම සංශෝධනය ගෙනඑන ලද්දේ 1956 සිට මේ රටේ ක්‍රියාත්මක වූ සිංහල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කණපිට හරවා දෙමළ මුළු රටේම රාජ්‍ය (පරිපාලන) භාෂාව බවට පත් කිරීමත් ප්‍රායෝගික වශයෙන් නැවතත් ඉංග්‍රීසි රජ කරුවීමත් සඳහා ය.

මෙම සංශෝධනය මගින් සිදුකර ඇති වෙනස්කම් මෙසේ යඃ

(අ) දෙමළ මුළු රටේම රාජ්‍ය (පරිපාලන) භාෂාව බවටත්, සිංහල උතුරු නැගෙනහිර හැර ඉතිරි පළාත් හතේ රාජ්‍ය (පරිපාලන) භාෂාව බවටත් පත් කිරීම. - (22(1) වගන්තිය)

(ආ) කිසියම් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක වාසය කරන

බහුතර ජනතාවත් එම ප්‍රදේශයේ වාසය කරන සිංහල හෝ දෙමළ භාෂාව කතා කරන සුළු ජන කොටසත් අතර ඇති ජන අනුපාතය සැලකිල්ලට ගෙන සිංහල හා දෙමළ භාෂා දෙක ම හෝ ඒ පලාතේ පරිපාලන භාෂාව නොවන වෙනත් භාෂාවක් ඒ ප්‍රදේශයේ පරිපාලන භාෂාව වශයෙන් යොදා ගන්නා ලෙස නියම කිරීමට ජනාධිපතිවරයාට බලය ලබා දීම.

(ඇ) සිංහල පරිපාලන භාෂාව වන පෙදෙස්වල වෙසෙන අසිංහලයන්ට රාජ්‍ය ආයතන සමග දෙමළ හෝ ඉංග්‍රීසි බසින් ගනුදෙනු කිරීමේත්, සියලු රාජ්‍ය ලේඛනවල පිටපත් දෙමළ හෝ ඉංග්‍රීසි බසින් ලබා ගැනීමේත් අයිතිය ලබා දීම. - (22(2) වගන්තිය)

(ඈ) පරිපාලන භාෂාව වශයෙන් වෙනස් භාෂාවකින් කටයුතු කරන පලාත් සභාවකට හෝ පලාත් පාලන ආයතනයකට වෙනත් රජයේ ආයතනයක් හෝ රාජ්‍ය නිලධාරියකු සමග ඉංග්‍රීසි බසින් ලිපි ගනුදෙනු කිරීමට, නිවේදන හුවමාරු කර ගැනීමට හා කටයුතු කිරීමට අයිතිය ලබා දීම. - (22(4) වගන්තිය)

(ඉ) රජයේ සේවයට, අධිකරණ සේවයට, පලාත්බද රජයේ සේවයට, පලාත් පාලන සේවයට හෝ යම් රාජ්‍ය ආයතනයකට බඳවා ගැනීමේ විභාගයට සිංහල හෝ දෙමළ හෝ වෙනත් තමන් තෝරා ගන්නා භාෂා මධ්‍යස්ථානයකින් පෙනී සිටීමේ අයිතිය ලබා දීම.- (22(5) වගන්තිය)

(ඊ) පලාත් සභා හා පලාත් පාලන ආයතන හැර, අනෙක් රාජ්‍ය ආයතන මගින් පනවන හා නිකුත් කරන නීතිරීති, රෙගුලාසි, නියෝග, චක්‍රලේඛ ආදිය පමණක් ඉංග්‍රීසි බසින් පරිවර්තනයක් ද සහිතව සිංහල හා දෙමළ භාෂාවලින් පළකළ යුතුවීම. - (23(2) වගන්තිය)

(උ) පලාත් සභා හා පලාත් පාලන ආයතන මගින් පනවන හා නිකුත් කරන නීතිරීති, රෙගුලාසි, නියෝග, චක්‍රලේඛ ආදිය ඉංග්‍රීසි පරිවර්තනයක් ද සහිතව එම පලාත් සභාව හා පලාත් පාලන ආයතන ක්‍රියාත්මක වන ප්‍රදේශයේ

පරිපාලන භාෂාවෙන් පමණක් පළකළ යුතුවීම. - (23(3) වගන්තිය)

(උ) රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල භාෂාව ශ්‍රී ලංකාව මුළුල්ලේ ම අධිකරණවල භාෂාව වශයෙන් පැවති තත්වය නැතිකොට දෙමළ භාෂාව රට පුරාම අධිකරණවල භාෂාව බවට පත් කිරීම. - (24(1) වගන්තිය) මෙම සංශෝධනය නිසා උතුරු නැගෙනහිර ජීවත්වන සිංහල ජනතාව ඔවුන්ගේ භාෂා අයිතිය මුළුමනින් ම අහිමිව ගොස් අන්ත අසරණ තත්වයට පත්ව ඇත.

## 15 වන හා 16 වන ව්‍යවස්ථා සංශෝධන දොළ පිදේනි කාටද?

- 1988 ජනාධිපතිවරණය පවත්වන ලද්දේ 1988 දෙසැම්බර් 19 වන දින ය. මේ 15 වන හා 16 වන සංශෝධන දෙක සම්මත කොට අනුමත කර ඇත්තේ ඊට දින දෙකකට පෙර 1988 දෙසැම්බර් 17 වනදා ය. එනම් ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරණ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත්ව සිටියදී ය.

- මෙ රටේ මැතිවරණ ක්‍රමය මුලුමනින් විකෘති කළ, රටේ අනාගත ඉරණම කෙරෙහි තීරණාත්මක බලපෑමක් කිරීමට හැකි අවියක් සුළු ජාතික බෙදුම්වාදීන් හා මුස්ලිම් අන්තවාදීන් අතට පත් කළ, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කණපිට හැරවූ, මේ සංශෝධන දෙක ගෙන එන ලද්දේ ජනාධිපතිවරණයේදී ප්‍රේමදාසට සුළු ජාතික ජන කොටස්වල සහාය ලබා ගැනීම සඳහා ය. ඒ මුස්ලිම් කොන්ග්‍රස් නායක අෂ්රොෆ්ගේ ඉල්ලීම ඉටු කිරීමක් වශයෙනි.

## 17 වන ව්‍යවස්ථා සංශෝධනය

2001 ඔක්තෝබර් 3 වන දින අනුමත කරන ලද මෙම සංශෝධනය 1978 ව්‍යවස්ථාව යටතේ රජයේ ඉහළ නිලතල වලට හා කොමිෂන් සභා වලට පත් කිරීම් සිදු කිරීමට ජනාධිපතිට පැවරී බලතල අත්තනෝමතික ලෙස පාවිච්චි කිරීම වැළැක්වීම පිණිස සියලු පක්ෂවල එකඟත්වය ඇතිව ගෙන එන ලද්දකි.

- රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභා 7ක් පිහිටුවීමටත් ඒ කොමිෂන් සභාවල සාමාජිකයන් හා උපරිමාධිකරණ විනිසුරුවරුන්, නීතිපති, පොලිස්පති වැනි රජයේ ඉහළ නිලතල දරන පුද්ගලයන් පත්කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීමටත්, ඒ පත්කිරීම් සියල්ල ජනාධිපති විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව සිදුකිරීමටත් මෙම සංශෝධනය මගින් ඉඩ සලසා ඇත.

- මෙම සංශෝධනයේ ප්‍රකාශිත අරමුණ යහපත් ලෙස පෙනුනද අවසානයේදී ඒ මගින් සිදුවූයේ පරමාධිපත්‍ය බලය හොබවන සහ මැතිවරණවලදී මහජනයාට වගවීමට සිදුවන ජනාධිපතිවරයෙකුගේ බලතල මහජනයාට වගනොවන **NGO** ක්‍රියාකාරිකයින් අතට පත්වීමය. ස්වාධින යැයි හඳුන්වන කොමිෂන් සභාවලට පත්කළ බොහෝ පුද්ගලයින්ගේ ක්‍රියාකලාපය අනුව ඔවුන් ස්වාධින නොවන බව මහජනයාට ඉතා හොඳින් පැහැදිලි විය. ඒ පිළිබඳව නරකම උදාහරණය සපයනු ලබන්නේ මැතිවරණ කොමිසමය.

## 18 වන ව්‍යවස්ථා සංශෝධනය

මහින්ද රාජපක්ෂ මහතා දෙවන වර ජනාධිපති වී 2010 මහ මැතිවරණය ද දිනීමෙන් පසු 2010 සැප්තැම්බර් 3 වන දින සම්මත කරන ලද මෙම සංශෝධනයෙන් සිදු කරන ලද්දේ 2001 සිට ඒ දක්වා පුරා වසර නවයක් තිස්සේ යුද්ධය පැවති කාලයේ පවා ක්‍රියාත්මක වූ සාමාජිකයන් 10 දෙනෙකු ගෙන් යුත් ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට සාමාජිකයන් 5 දෙනෙකු ගෙන් යුත් පාර්ලිමේන්තු සභාවක් නාමිකව පත් කරගෙන එහි පවා අනුමැතියකින් තොරව තම තනි මතයට රජයේ ඉහළ නිලතල වලට හා කොමිෂන් සභා වලට පත් කිරීම් සිදු කිරීමේ බලය ලබා ගැනීමයි.

- මෙය කිසිසේත් අවශ්‍ය නොවූ සංශෝධනයකි. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය හා විදේශීය වශයෙන් ඒ රජය දැඩි අප්‍රසාදයකට ලක් වූ අතර එමගින් ඒකාධිපති ලේබලය යොදාගෙන ආණ්ඩුවට පහර ගැසීමට ආණ්ඩුවේ සතුරන් අතට හොඳ ආයුධයක් ලබා දුනි.

## 19 වන ව්‍යවස්ථා සංශෝධනය

2015 දී යහපාලන ආණ්ඩුවේ දින සියයේ වැඩපිළිවෙල යටතේ 19 වන සංශෝධනය ගෙනඒමේ ප්‍රකාශිත අරමුණ වූයේ 18 වන සංශෝධනය අහෝසි කොට, ව්‍යවස්ථා සභාව හා ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවා, විධායක ජනාධිපතිගේ බලතල හා මුක්තිය සීමාකර, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම ය. ඊට අමතරව ඇමති ධුර සංඛ්‍යාව සීමා කිරීමත්, ද්විත්ව පුරවැසියන්ට මන්ත්‍රී ධුර දැරීම තහනම් කිරීමත් එයට ඇතුළත් විය. ඒ සියල්ල සාධනීය කරුණු ලෙස සැලකිය හැක.

- එහෙත් මේ පනත ගෙන ඒමේ සැබෑ අරමුණ ඊට බොහෝ වෙනස්,සහ සඟවා තිබූ එකකි. එහි සැබෑ අරමුණ වූයේ ජනපති සතු ක්‍රියාකාරී විධායක බලතල සියල්ල ජනපති ගෙන් ඉවත් කොට, ඒ සියල්ල නියමින් සහ අනියමින් අගමැති අතට ගෙන, ජනපතිවරයා කිසිදු ක්‍රියාකාරී බලයක් නැති, රජයේ සියලු ආයතන පාලනය කළ හැකි ක්‍රියාකාරී විධායක බලය හිමි අගමැති කියන දේ කිරීම හැර වෙන දෙයක් කිරීමේ බලයක් නැති, රූකඩයක් බවට පත්කර ගෙන පාලනය ගෙනයාම ය. වෙනත් ආකාරයකින් කියතොත් ජනතා පරමාධිපත්‍ය සිරිකොත ආධිපත්‍යයට යටකර පවත්වා ගෙනයාම ය.

- මෙය සිදු කරන ලද්දේ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන සංශෝධන යැයි ලේඛනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කොට අධිකරණය නොමග යවා ඒ කිසිවක් ඉදිරිපත් නොකර, ඉදිරිපත් කරන ලද සංශෝධන ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ ඒවා යයි බොරු කියා මන්ත්‍රීවරුන් මුලා කොට, ඉදිරිපත් කර ලද සංශෝධන කිසිවක් කියවන්නට හෝ බලන්නට මන්ත්‍රිවරුන්ට අවස්ථාවක් නොදී, ඔවුන්ගේ ඇස් වසා ඔවුන් අඳුරේ තබා, විපක්ෂයේ සංශෝධන කිසිවක් ඉදිරිපත් කරන්නට විපක්ෂයට අවස්ථාවක් නොදී විපක්ෂයේ කට වසා, රාත්‍රී ආහාරයෙන් පසු මන්ත්‍රීවරුන් නිදා වැටෙන වේලාවේ ඔවුන්ගේ අනවධානය තුළ කාරක සභා අවස්ථාවේදී යම් තීරණාත්මක සංශෝධන පනත තුළට රිංගවීමෙනි.

- මේ සංශෝධන ඉදිරිපත් කරන ලද්දේ යහපාලන ආණ්ඩුවේ අධිකරණ ඇමති වූ විජේදාස රාජපක්ෂ මහතා විසිනි.

ශ්‍රේෂ්ඨාධිකරණය නොමග යවා, මන්ත්‍රීවරුන් මුලා කොට ඔවුන්ගේ ඇස් වසා, වංචනික ලෙස කාරක සභා අවස්ථාවේදී මේ පනත සම්මත කරන ලද ආකාරය එළිදරව් කරමින් ''19 වන ව්‍යවස්ථා සංශෝධනය, ජනතා පරමාධිපත්‍යය සහ සිරිකොත ආධිපත්‍යය" යන මැයෙන් මා විසින් නිබන්ධයක් පළ කොට ඇත.

- 19 නිසා සිදු වූයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් වීම නොව ජනාධිපති, අගමැති හා කථානායක වශයෙන් බල කේන්ද්‍ර තුනක් ඇති වී, ජනාධිපතිට විධායක බලය නිසියාකාරව ක්‍රියාත්මක කළ නොහැකි වී, රට අස්ථාවර වීම ය. ඊට අමතරව ඒ මගින් ප්‍රජාතන්ත්‍රවාදයේ බරපතළ විකෘතියක් වූ ව්‍යවස්ථා සංශෝධන කුමන්ත්‍රණයක් සඳහා පූර්වාදර්ශයක් සැපයුනි.

## 20 වන ව්‍යවස්ථා සංශෝධනය

ගෝඨාභය පාලනය 20 වන සංශෝධනය ගෙන එන ලද්දේ 19 වන සංශෝධනය ඉවත් කොට 18 වන සංශෝධනය නැවත බල ගැන්වීම සඳහා ය.

- 19 මගින් කොමිෂන් සභා හා ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ ජනාධිපති සතු බලතල උදුරා ගෙන ඒවා ව්‍යවස්ථා සභාවට පවරන අතරම ඒ බලතල ක්‍රියාත්මක කිරීමේදී සැළකිල්ලට ගතයුතු සාධනීය කරුණු ගණනාවක් ද එයට ඇතුළත් කර තිබුණි. එහෙත් 20 මගින් 19 ඉවත් කිරීමේදී ආණ්ඩුව 19 යේ තිබූ හානිකර දේ මෙන් ම යම් සාධනීය කරුණු ද ඉවත් කර ඇත.

- 20 මගින් ව්‍යවස්ථා සභාව ඉවත් කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පිහිටු වුවද ඒ පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ නො සළකා ජනාධිපතිවරයාගේ තනි කැමැත්තට කොමිෂන් සභා වල සාමාජිකයන් හා ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමටත් ඉවත් කිරීමටත් බලය ලබා දී ඇත.

- (අ) විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කොට විගණන නිලධාරීන්ගේ විනය පාලනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට

පැවරීම. (ආ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම. (ඇ) ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති ලේකම් කාර්යාලය ද කොටස් වලින් සියයට 50 කට වඩා රජයට හෝ රාජ්‍ය සංස්ථා වලට හෝ පලාත් පාලන ආයතනවලට හිමි සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති සමාගම් ද විගණකාධිපතිගේ විගණනයෙන් බැහැර කිරීම. (ඈ) පොලිස් නිලධාරීන්ගේ බඳවා ගැනීම හා විනය පාලනය ජාතික පොලිස් කොමිසමෙන් ඉවත් කොට රාජ්‍ය සේවා කොමිසමට පවරා ජාතික පොලිස් කොමිසම පොලිස් නිලධාරීන්ට එරෙහි මහජන පැමිණිලි විමසීම පමණක් සිදු කරන ආයතනයක් බවට පිරිහෙළීම. සහ (ඉ) ද්විත්ව පුරවැසියන්ට පනවා තිබූ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමේ හෝ ජනාධිපති ධුරයට තරඟ කිරීමේ තහනම ඉවත් කිරීම ආදීය 20 වන සංශෝධනය මගින් සිදු කරන ලද අනෙක් නිශේධාත්මක සංශෝධන අතර වේ.

- මේ 18, 19 හා 20 යන ව්‍යවස්ථා සංශෝධන තුනෙන් ම රටට ජනතාවට හෝ ඒවා ගෙන ආ ආණ්ඩුවලට හෝ සිදුවූ සෙතක් නැත. සිදු වූයේ ඒ ආණ්ඩුවල ගරා වැටීම ඉක්මන් වීම පමණකි.

## ව්‍යවස්ථා සංශෝධන සම්මත කිරීමේදී කාරක සභා අවස්ථාවේ කරන වංචනික ක්‍රියා හෙවත් ව්‍යවස්ථා සංශෝධන කුමන්ත්‍රණ

- 1978 ව්‍යවස්ථාව පනවන අවස්ථාවේදී විශේෂයෙන් ආරක්ෂිත වගන්ති ලැයිස්තුවට ඇතුළත් කර තිබූ ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය අගමැති ප්‍රේමදාසගේ පවා ඇස් වසා එම ලැයිස්තුවෙන් ඉවත් කරන ලද ආකාරය මෙහි ඉහත විස්තර කර ඇත. පලාත් සභා පිහිටුවීම සඳහා ගෙන ආ 13 වන සංශෝධනය ජනමත විචාරණයකින් තොරව සම්මත කළ හැකි වූයේ ඒ නිසා ය.

- 19 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේදී කාරක සභා අවස්ථාවේදී ද මෙහි ඉහතින් විස්තර කර ඇති පරිදි අනුගමනය කරන ලද්දේ එවැනිම වංචනික ක්‍රියාමාර්ගයකි. එහිදී පනතේ තිබූ ජනාධිපතිගේ විධායක බලය අහිමි කෙරෙන වගන්ති 6 ක් ජනමත විචාරණයකින් තොරව සම්මත කළ නොහැකි යයි ශ්‍රේෂ්ඨාධිකරණය දී තිබූ තීන්දුව ප්‍රයෝග

ික වශයෙන් මුළුමනින් ම බල රහිත කරන වගන්තියක්, අගමැති ඉවත් කිරීමේ බලය ජනාධිපතිට අහිමි කෙරෙන වගන්තිය, ඒ හා කිසිම සම්බන්ධයක් නැති තැනකට, එනම් 46 වන වගන්තිය තුළට, මන්ත්‍රීවරුන්ගේ ඇස් වසා රිංගවන ලදී. ජනපති අගමැති අතේ නැටවිය හැකි රූකඩයක් බවට පත්වූයේ ඒ නිසා ය.

- 2022 ජුනි මස 23 වන දින අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියෙහි අනාවරණය කර තිබූ පරිදි 1988 පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත සම්මත කිරීමේදී ද මෙවැනි තක්කඩි ක්‍රියාවක් සිදුකර ඇත. ජාතික ලැයිස්තුවේ ඇතිවන පුරප්පාඩුවක් පිරවීම සඳහා ඕනෑම පක්ෂ සාමාජිකයකු නම් කිරීමට ඉඩ දෙන වගන්තියක් පාර්ලිමේන්තුව සම්මත කළ පනතේ නො වීය. මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී වගන්තිය රිංගවා ඇත්තේ පනත සම්මත කිරීමෙන් පසුව ය. මේ කාරණය එළියට අවුත් ඇත්තේ 2015 මහ මැතිවරණයෙන් පසු ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් පත්කිරීමේ ව්‍යවස්ථානුකූල භාවය ගැන මතුවූ හබයකදී ය.

- යහපාලනය, සාධාරණ සමාජයක් ඇති කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම, නීතියේ ආධිපත්‍ය ගැන කතා කරන සියලු පක්ෂවලට අයත් අපේ දේශපාලන නායකයන් සිය අවස්ථාවාදී දේශපාලන උවමනාවන් ඉටුකර ගැනීම පිණිස පනත් සම්මත කිරීමේ ක්‍රියාවලියේ කාරක සභා අවස්ථාවේදී කොතරම් නිර්ලජ්ජිත ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු නොසළකා හරිමින්, ජනතා පරමාධිපත්‍යය මංකොල්ල කමින් ක්‍රියා කිරීමට නො පැකිළෙන්නේ දැයි යහපාලන ආණ්ඩුව 2017 පලාත් සභා මැතිවරණ (සංශෝධන) පනත සම්මත කළ ආකාරය විමසා බලන විට පැහැදිලිව පෙනේ.

- 2017 ජූලි 26 වන දින පලාත් සභා මැතිවරණ (සංශෝධන) පනත නමින් අංක 195 දරන පනත් කෙටුම්පතක් ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. වගන්ති 4 කින් හා පිටු 2 කින් යුත් ඒ පනත ගෙනවුත් තිබුණේ පලාත් සභා මැතිවරණ සඳහා ඉදිරිපත් කළයුතු කාන්තා නියෝජනය සියයට 30 දක්වා වැඩි කිරීම සඳහා ය. එහෙත් ඒ පනත

සැප්තැම්බර් මැද වන තුරුත් පාර්ලිමේන්තුවේ විවාදයට ගෙන නොතිබුණි.

- 2017 සැප්තැම්බර් 17 වන දින උතුරු මැද, නැගෙනහිර හා සබරගමුව පලාත් සභා ඒවායේ කාලය ඉකුත් වීමෙන් නීතිය අනුව ඉබේම විසිරී ගියේ ය. පලාත් සභා මැතිවරණ පනත අනුව පලාත් සභාවක් විසිරී සතියක් ඇතුළත මැතිවරණ කොමිසම පලාත් සභා මැතිවරණ පැවැත්වීම සඳහා නාම යෝජනා කැඳවමින් නිවේදනයක් පළ කළ යුතු ය. ඒ වෙලාවේ මැතිවරණ පැවැත්වුව හොත් අත්වන ඉරණම ගැන දැන සිටි ආණ්ඩුවට අවශ්‍ය වූයේ මැතිවරණ කල් දමා ගැනීමට ය. ඒ අනුව ක්‍රියාත්මක වූ ආණ්ඩුව පලාත් සභා මැතිවරණ කල් දමා ගැනීම සඳහා ලහි ලහියේ 20 වන ව්‍යවස්ථා සංශෝධන පනත ගෙන ආවේ ය. ඒ ගැන විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණය ජනමත විචාරණයකින් තොරව එය සම්මත කළ නොහැකි බවට වූ සිය තීන්දුව සැප්තැම්බර් 19 වන දින කථානායක වෙත දැනුම් දුන්නේ ය. ඒ නිසා එය සම්මත කර ගැනීමේ හැකියාවක් ආණ්ඩුවට නො තිබුණි.

- පලාත් සභා මැතිවරණ පනතේ 10 (1) වගන්තිය අනුව, සැප්තැම්බර් 17 වන දින විසිරුනු පලාත් සභා තුන සඳහා නාම යෝජනා කැඳවමින් මැතිවරණ කොමිසම සැප්තැම්බර් 25 වන දින නිවේදනයක් පළ කළ යුතුව තිබුණි. එය කෙසේ හෝ වළක්වා ගෙන, පලාත් සභා මැතිවරණ කල් දමා ගැනීම ආණ්ඩුවේ අවශ්‍යයතාවය විය.

- ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කථානායක වෙත ලැබුනු සැප්තැම්බර් 19 වන දින ම, අගමැති රනිල් වික්‍රමසිංහ පලාත් සභා මැතිවරණ (සංශෝධන) පනත නමින් ම වූ තවත් පනතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළේ ය. අංක 204 දරන එම පනත ගෙනවුත් තිබුණේ විසිරී ගිය පලාත් සභාවක් වෙනුවෙන් මැතිවරණ කොමිසම විසින් මැතිවරණයක් පැවැත්වීම සඳහා නාම යෝජනා කැඳවිය යුතු කාලය සතියේ සිට සති තුනක් දක්වා දික් කිරීම ඇතුලු පලාත් සභා මැතිවරණ පනතේ වගන්ති ගණනාවක් සංශෝධනය කිරීම සඳහා ය. එය වගන්ති 30 කින් පමණ යුතු පිටු 25 ක් පමණ දිග පනතකි. එහි ව්‍යවස්ථානුකූල භාවය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සළකා බැලිය

යුතුව ඇති හෙයින් සති තුනක් ගතවන තුරු නෛතිකව එය පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමේ හැකියාවක් නො තිබුණි. ඊට පසු දින, එනම්, සැප්තැම්බර් 20 වන දින කාන්තා නියෝජනය සියයට 30 දක්වා වැඩි කිරීම සඳහා ගෙනවුත් තිබූ අංක 195 දරන පනත පාර්ලිමේන්තුවේ විවාදයට ගන්නා ලදී. කාන්තා නියෝජනය වැඩි කිරීම ගැන කිසිවකුගේ විරුද්ධත්වයක් නොවී ය. සියලු මන්ත්‍රීවරු පනතට පක්ෂව කතා කොට පනත දෙවනවර කියවා සම්මත කළහ. අනතුරුව වූයේ කාරක සභා අවස්ථාවයි. එහිදී සිදු වූයේ අපූරු දෙයකි, එහෙත් බරපතළ වංචාවකි. විවාදයට ගත් අංක 195 දරන පනතේ තිබූ කාන්තා නියෝජනය වැඩි කිරීමට අදාළ වගන්ති දෙක ඉවත් කොට, ඒ වෙනුවට, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ව්‍යවස්ථානුකූලභාවය සළකා නොබැලූ, ව්‍යවස්ථාවට අනුව සති දෙකක් ගතවන තුරු විවාදයට ගත නොහැකි, පාර්ලිමේන්තුවේ විවාදයට භාජනය නොවූ, මන්ත්‍රීවරුන් කියවා බලා නොමැති, අංක 204 දරන පනතේ වූ පිටු විසි ගණනක වගන්ති 24 ක්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝගයන් පවා අත්හිටුවා, එතැනට රිංගවීමයි. මේ ක්‍රියාදාමයේ ව්‍යවස්ථා විරෝධී භාවය ගැන ඇතැම් මන්ත්‍රීවරුන් විරෝධය පළ කළ විට කථානායක කරු ජයසූරිය මහතා පැවසුවේ තමා ඒ ගැන නීතිපති උපදෙස් ලබා ගත් බවත් නීතිපතිගේ නියෝජිතයකු තමා සමග සිටින බවත්, එය තුනෙන් දෙකේ බහුතරයකින් කළ හැකි බවට නීතිපති උපදෙස් දී ඇති බවත් ය.

- පාර්ලිමේන්තුවේදී එක් පනතක් විවාදයට ගෙන සම්මත කොට එහි කාරක සභා අවස්ථාවේදී ඒ පනතේ සියලු වගන්ති ඉවත් කොට පාර්ලිමේන්තුවේදී විවාදයට නොගත් වෙනත් පනතක ඊට අදාළ නොවන වගන්ති ඒ තුළට රිංගවා මන්ත්‍රීවරුන්ගේ විරෝධතා මැද වංචනික ලෙස සම්මත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කිරීමකි. ජනතා පරමාධිපත්‍ය මංකොල්ල කෑමක. ශ්‍රේෂ්ඨාධිකරණය හෑල්ලුවට ලක් කිරීමකි. නීත්‍යානුකූලව ඉටුකර ගත නොහැකි දේශපාලන අරමුණු ඉටුකර ගැනීම පිණිෂ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය අයුතු හා නීතිවිරෝධී ලෙස යොදා ගැනීමකි.

- මේ පනත සම්මත කිරීමේදී සිදුවූ අනෙක් බරපතළ වරදනම් ඒ සඳහා අවශ්‍ය තුනෙන් දෙකේ බහුතරය ලබා ගැනීම පිණිස

අන්තවාදී සුළු ජාතික පක්ෂවල අසාධාරණ සහ ප්‍රයෝගික නොවන ඉල්ලීම්වලට එකඟවීමට ආණ්ඩුවට සිදුවීමයි. එහිදී මනෝ ගනේෂන්, රාවුෆ් හකීම් හා රිෂාඩ් බදියුදීන් විසින් ඉල්ලීම් තුනක් ඉදිරිපත් කර තිබුණි. කොට්ඨාශ හා මනාප ක්‍රමය අනුව මන්ත්‍රීන් තේරීම සඳහා පනතේ යෝජනා කර තිබූ 60 : 40 අනුපාතය 50 : 50 බවට වෙනස් කිරීම එක් ඉල්ලීමකි. සීමානිර්ණ කොමිසමේ වාර්තාව පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත කළ යුතුය යන්න තව ඉල්ලීමකි. මේ ඉල්ලීම් සියල්ල කාරක සභා අවස්ථාවේදී පනතට ඇතුළත් කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝණය කරමින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයන්ට හා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට පටහැනිව, වංචනික ලෙස සම්මත කළ මේ පනතේ ව්‍යවස්ථානුකූලභාවය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරමින් හිටපු අග විනිසුරු සරත් නන්ද සිල්වා මහතා මේ නීතිවිරෝධී ක්‍රියාවලියට දායක වූ නීතිපතිට, කථානායක කරු ජයසූරියට හා මැතිවරණ කොමිසමට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා තමා අධිකරණය හමුවේ පෙනී සිට කරුණු දැක්වීය. මම ද අතුරු පෙත්සම්කරුවකු වශයෙන් මේ නඩුවට මැදිහත්ව මේ නීතිවිරෝධී ක්‍රියාවලියට එරෙහිව කරුණු දැක්වීම්.

- ආණ්ඩුවක් දේශපාලන වාසි තකා නීති පැනවීමේදී මෙලෙස ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරමින්, වංචනික ලෙස නීති පැනවීමට කටයුතු කරයි නම්, එය ඉතා බිහිසුණු තත්වයකි. එවැනි ආණ්ඩුවකට කළ නොහැකි අපරාධයක් නැත. එහෙත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ගෝල්ෆේස් අරගලයට සම්බන්ධ වී නීතියේ ආධිපත්‍යය ඇති කිරීම හා මානව හිමිකම් සුරැකීම ගැන කෑමොර ගසන සිවිල් සංවිධාන කිසිවක් හෝ ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂ හෝ මෙවැනි තක්කඩි ක්‍රියාවන්ට එරෙහිව කිසිදු හඬක් නැගීමට ඉදිරිපත් නොවීය.

- අධිකරණය හමුවේ නීතිපතිට අමතරව ආණ්ඩුවේ මේ තක්කඩි ක්‍රියා පිළිවෙත ආරක්ෂා කරමින් පෙනී සිටියේ නීතියේ ආධිපත්‍යය හා මානව හිමිකම් සුරැකීම ගැන නිරතුරුව

කතා කරන එම්.ඒ. සුමන්දිරන්ය. පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද පනතක් කථානායක අත්සන් කොට අනුමත කිරීමෙන් පසු ඒ පනතේ ව්‍යවස්ථානුකූලභාවය ගැන හෝ පාර්ලිමේන්තුව තුළ පනත සම්මත කිරීමේ ක්‍රියාවලියේදී සිදු වූ වැරදි අඩුපාඩු දෝෂ ගැන හෝ විමසා බැලීමේ අයිතියක් හෝ බලයක් අධිකරණයට නැති බවට අග විනිසුරු සරත් නන්ද සිල්වා මහතා අග විනිසුරුව සිටියදී දෙන ලද තීන්දු ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු කිහිපයක් ගෙනහැර දක්වමින් සුමන්දිරන් කියා සිටියේ මොන තරම් වැරදි අඩුපාඩු තිබුණත් දැන් ඒ ගැන විමසා බැලීමේ අයිතියක් හෝ බලයක් අධිකරණයට නැති බව ය. අපි ඊට එරෙහිව කරුණු දැක්වීමු. තීන්දුව කල් තැබූ අධිකරණය පසුව අපේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි.

## යෝජිත 21 වන ව්‍යවස්ථා සංශෝධනය, ඊළඟ ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් විය හැකිද?

- ජනාධිපති ගෝඨාභය යටතේ අගමැති ධුරයට පත් වූ රනිල් වික්‍රමසිංහ මහතා විජේදාස රාජපක්ෂ මහතා මගින් ළහි ළහියේ 21 වන සංශෝධනය ගෙන ඒමට කටයුතු කළේ 20 වන සංශෝධනය ඉවත් කොට ජනාධිපතිගේ විධායක බලතල සීමාකර ඉන් කොටසක් අගමැති අතට ලබාගෙන ද්විත්ව පුරවැසියන්ට මන්ත්‍රීධුර දැරීමේ හැකියාව අහිමි කර 19 වන සංශෝධනය යටතේ පැවති ආකාරයට ව්‍යවස්ථා සභාව හා සියලු ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවා බල ගැන්වීම සඳහා ය.

- සියලු පාර්ශ්ව සමග සාකච්ඡා කර උතුරු නැගෙනහිර ජනතාවගේ බලතල බෙදීම පිළිබඳ ඉල්ලීම් වලට සහන සැලසෙන ආකාරයේ සම්මුතිවාදී ව්‍යවස්ථාවක් ගෙන එන බව වික්‍රමසිංහ මහතාත් රාජපක්ෂ මහතාත් වරින්වර ප්‍රකාශ කර තිබුණි.

- දැන් පූර්ණ විධායක බලතල සහිත ජනාධිපති ධුරයට පත්ව සිටින වික්‍රමසිංහ මහතාට ජනාධිපති බලතල සීමාකර ඒවා අගමැතිට පැවරීමේ උවමනාවක් ඇතැයි සිතිය නො හැකි ය. ඒනිසා දැන් ඔහුගේ උවමනාව වනු ඇත්තේ ව්‍යවස්ථා සභාව

හා ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවීමත් උතුරු නැගෙනහිර ජනතාවගේ බලතල බෙදීම පිළිබඳ ඉල්ලීම් සපුරාලීමත් ය.

- අගමැති ලෙස රනිල් වික්‍රමසිංහ මහතා සහ විජයදාස රාජපක්ෂ මහතා දිගින් දිගටම ප්‍රකාශ කළේ 21 වන ව්‍යවස්ථා සංශෝධනය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට එහි අදහස් ලබා ගෙන වහාම සියලු දේශපාලන පක්ෂ වෙත ඉදිරිපත් කොට කඩිනමින් ඒවායේ අදහස් ද ලබා ගෙන එය වැඩි දියුණු කොට නැවත කැබිනට් අනුමැතිය ලබා ගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවයි. ආණ්ඩුව කියන පරිදි මේ ව්‍යවස්ථා සංශෝධනය සඳහා විවිධ දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරන යෝජනා මෙන්ම නිර්පාක්ෂික අරගලකරුවන්ගේ යෝජනා ආණ්ඩුවට ලැබී ඇත.

- ආණ්ඩුව විසින් දැනට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති 21 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇත්තේ ජනපති බලතල සීමා කොට ව්‍යවස්ථා සභාව හා සියලු ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවා 19 වන ව්‍යවස්ථා සංශෝධනය කලින් පැවති ආකාරයට නැවත බල ගැන්වීමට අදාල වගන්ති පමණකි. විවිධ දේශපාලන පක්ෂ ඉදිරිපත් කර ඇති යෝජනා හෝ උතුරු නැගෙනහිර ඊනියා ජනතා ඉල්ලීම් වලට සහන සලසන යෝජනා කිසිවක් හෝ ඊට ඇතුළත්ව නැත.

- ව්‍යවස්ථා සංශෝධනය සඳහා විවිධ දේශපාලන පක්ෂ ඉදිරිපත් කර ඇති යෝජනා මොනවාද? උතුරු නැගෙනහිර ජනතා ඉල්ලීම් මොනවාද? ඒවාට සහන සැලසීම සඳහා ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන යෝජනා මොනවාද? ඒ සියල්ල කල් ඇතිව දැන ගැනීමේ අයිතියක් මේ රටේ ව්‍යවස්ථාදායක බලය හිමි ජනතා පරමාධිපත්‍ය හිමි මුළු මහත් ජනතාවට ඇත. ආණ්ඩුව ඒ සියල්ල ජනතාව ගෙන් වසංකොට තබාගෙන ඇත්තේ මන්ද? අවසාන මොහොත දක්වා වසංකොට තබාගැනීමට උත්සාහ කරන්නේ මන්ද? රටට හා ජනතාවට හානිකර කිසියම් කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතින නිසාද?

# බෙදුම්වාදී ඉල්ලීම් සපුරාලීමේ අනතුර

- ව්‍යවස්ථා සංශෝධනය තුලින් දෙමළ බෙදුම්වාදීන්ගේ ෆෙඩරල් රාජ්‍යයක ඉල්ලීම් ඉටුකර ගැනීම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඉතාම හිතකර තත්වයක් අද උදා වී පවතී. 13 වන සංශෝධනය සපුරා ක්‍රියාත්මක කරන ලෙස ඉන්දියාව ද අපේ ආණ්ඩුවට නොකඩවා බලපෑම් කරයි. රට බරපතල ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින මේ අවස්ථාවේදී ලොව පුරා පැතිර සිටින දෙමළ ඩයස්පෝරාවේ ඩොලර් පෙන්වා සිදුකරන බලපෑම ද ඉතා විශාල ය. උතුරු - නැගෙනහිර සංවර්ධනය සඳහා මුදල් ආයෝජනය කිරීමට දෙමළ ඩයස්පෝරා කණ්ඩායම් සූදානම් බව දැනුම් දී ඇති අතර ආණ්ඩුව එය ඉත සිතින් පිළිගෙන ඇත. ආණ්ඩුව දැනටමත් ඩයස්පෝරා සංවිධාන 6 කට හා පුද්ගලයන් 316 දෙනෙකුට පනවා තිබූ තහනම ඉවත් කොට ඇත.

- සම්බන්ධන්ලා අද ඉල්ලන්නේ වෙනම රාජ්‍යයක් නොව එක රටක් තුල උතුරු නැගෙනහිර පලාත් ඔවුන්ගේ ඓතිහාසික නිජ බිම ලෙස වෙනම පාලනයක් ගෙනයාමේ බලයයි. සම්බන්ධන්ලා කියන මේ බලතල සියල්ල ක්‍රියාත්මක වශයෙන් උතුරු - නැගෙනහිර පලාත් සභාවට ලබා ගැනීමට නොහැකිව ඇත්තේ සිය අභිමතය පරිදි පලාත් ආණ්ඩුකාරවරුන් පත් කොට ඔවුන් මගින් සිය විධායක බලය ක්‍රියාත්මක කරමින් පලාත් සභා සතු මූල්‍ය, පොලිස්, ඉඩම් හා ව්‍යවස්ථා සම්පාදන බලතල පාලනය කිරීමට ජනාධිපතිවරයාට ඇති හැකියාව නිසා ය. ක්‍රියාත්මක වශයෙන් මේ බලතල පලාත් සභාවට ලබා ගැනීම සඳහා කළ යුතුව ඇත්තේ ඉතා සුලු සංශෝධනයකි. දැනට ජනපතිගේ අභිමතය අනුව සිදු කෙරෙන පලාත් ආණ්ඩුකාරවරුන් පත් කිරීම මහඇමතිගේ උපදෙස් අනුව සිදු කිරීමටත් ආණ්ඩුකාරවරුන් සිය බලතල ක්‍රියාත්මක කිරීම පලාත් මහ ඇමතිවරුන්ගේ කැමැත්ත අනුව සිදු කිරීමටත් ඉඩ සැලසීම ය. එවිට ඔවුන්ට උතුරු නැගෙනහිර පූර්ණ ෆෙඩරල් පාලනයක් පවත්වා ගෙන යා හැකිය. එහි අවසාන ප්‍රතිඵලය රට බෙදා වෙන්කිරීමය.

# දේශප්‍රේමී ජාතික හා ජනතා සංවිධානවල කාර්යභාරය

- 21 වැනි ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තුළ කාරක සභා අවස්ථාවේදී සිදුකරන සුළු වෙනසක් මගින් මේ රට පූර්ණ ෆෙඩරල් රාජ්‍යක් බවට පත්කර ගැනීමේ බිහිසුණු අනතුරක් තිබේ. සිදුවිය හැකි මේ මහා ව්‍යසනය වළක්වා ගැනීමට ඇත්තේ එකම එක විදියකි. එනම්, කල් ඇතිව ජනතාව වෙත ඉදිරිපත් කර නැති කිසිම සංශෝධනයක් අවසාන මොහොතේ, කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් නොකෙරෙන බවටත්, අවසාන මොහොතේ, කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කෙරෙන කිසිම සංශෝධනයකට තුනෙන් දෙකේ බහුතරය නො ලැබෙන බවටත් වග බලා ගැනීමයි.

- ආණ්ඩුවේ ඉල්ලීම පරිදි ව්‍යවස්ථා සංශෝධනය සඳහා විවිධ දේශපාලන පක්ෂ මගින් ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇති යෝජනා සියල්ල ජනතාවගේ දැන ගැනීම සඳහා එළිදක්වන ලෙස සියලු ජනතා සංවිධාන, ජාතික සංවිධාන සහ දේශපාලන පක්ෂ විසින් ආණ්ඩුවට බලකර කියා සිටිය යුතු ය.

- එසේම දැනට ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති 21 වන ව්‍යවස්ථා සංශෝධනයට කවර හෝ පක්ෂයක් විසින් කාරක සභා අවස්ථාවේදී ගෙන ඒමට අදහස් කරන සංශෝධන සියල්ල, විශේෂයෙන් උතුරු නැගෙනහිර බලය බෙදීමට අදාළ සංශෝධන සියල්ල, මෙම පනත පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට අවම වශයෙන් සති දෙකකට වත් කලින්, ප්‍රකාශයට පත් කර ජනතාවට දැන ගැනීමට ඉඩ සලස්වන ලෙස සියලු ජනතා සංවිධාන, ජාතික - ආගමික සංවිධාන හා දේශපාලන පක්ෂ ආණ්ඩුවට තරයේ බලකර කියා සිටිය යුතු ය. එසේ කල් ඇතිව ඉදිරිපත් කර නැති කිසිම සංශෝධනයක් අන්තිම මොහොතේ, කාරක සභා අවස්ථාවේදී, බාර නොගන්නා ලෙස ජනාධිපති තුමාගෙන්, අගමැති තුමාගෙන්, අධිකරණ ඇමතිතුමාගෙන් හා කථානායකතුමාගෙන් තරයේ ඉල්ලා සිටිය යුතු ය.

- තමාට කල්වේලා ඇතිව කියවා බලා අධ්‍යනය කිරීමට අවස්ථාවක් නොලැබුනු, එසේ අන්තිම මොහොතේ ගෙන එන,

සංශෝධන වලට පක්ෂව ඡන්දය දීමෙන් වළකින ලෙස සියලු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිය යුතු ය.

- මන්ත්‍රීවරුන්ගේ නොසැළකිලිමත්භාවය නිසා කාරක සභා අවස්ථාවේදී 13වැනි සංශෝධනය බලාත්මක කෙරෙන සංශෝධන කූඨ ලෙස ඇතුළත් කළහොත් ඒ මහා පාවාදීමට දායක වන කිසිවෙකුට ඉතිහාසයෙන් සමාවක් නොලැබෙන බවද ඔවුන්ට පෙන්වා දිය යුතුය. පනත් කෙටුම්පත සම්මත වීමට ඉඩහැර ඡන්දය නොදී සිටීමෙන් පමණක් එම පාපයෙන් ගැලවිය නොහැකි බවද අවධාරණය කළ යුතුය. බෙදුම්වාදයට එරෙහිව දිවි පිදූ 60000ක් තරුණයින්ගේ මෙන්ම 30000ක් රණවිරුවන්ගේ සහ අත පය ඇස් දන්දුන් අදත් ජීවත්වන එවැනිම විරුවන් පිරිසකගේ ශාපයෙන් ඔවුනට ගැලවිය නොහැකි බව ද ඒත්තු ගැන්විය යුතුය.

# 15 වන හා 16 වන ව්‍යවස්ථා සංශෝධන දොළ පිදේනි කාටද?

1988 ජනාධිපතිවරණය පවත්වන ලද්දේ 1988 දෙසැම්බර් 19 වන දින ය. මේ 15 වන හා 16 වන සංශෝධන දෙක සම්මත කොට අනුමත කර ඇත්තේ ඊට දින දෙකකට පෙර 1988 දෙසැම්බර් 17 වනදා ය. එනම් ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරණ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත්ව සිටියදී ය.

මෙ රටේ මැතිවරණ ක්‍රමය මුලුමනින් විකෘති කළ, රටේ අනාගත ඉරණම කෙරෙහි තීරණාත්මක බලපෑමක් කිරීමට හැකි අවියක් සුළු ජාතික බෙදුම්වාදීන් හා මුස්ලිම් අන්තවාදීන් අතට පත් කළ, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කණපිට හැරවූ, මේ සංශෝධන දෙක ගෙන එන ලද්දේ ජනාධිපතිවරණයේදී ප්‍රේමදාසට සුළු ජාතික ජන කොටස්වල සහාය ලබා ගැනීම සඳහා ය. ඒ මුස්ලිම් කොන්ග්‍රස් නායක අෂ්රොෆ්ගේ ඉල්ලීම ඉටු කිරීමක් වශයෙනි.



# ව්‍යවස්ථා කුමන්ත්‍රණ පරදවමු!

2015 - 2019 ඊනියා යහපාලන ආණ්ඩුවේ අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහ එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා එකට එක්ව ශ්‍රේෂ්ඨාධිකරණය නොමග යවා,මන්ත්‍රීවරුන් මුලාකොට, ඔවුන්ගේ ඇස්වසා, විපක්ෂයේ කටවල් වසා වංචනික ලෙස පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ අඩංගු නොවූ සංශෝධන රාශියක් ඇතුල් කිරීම මගින් එම දෙපළ විසින් සැළසුම් සහගතව දියත් කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ බලහත්කාරී මෙහෙයුම රටට එළිදරව් කරමින් ජ්‍යෙෂ්ඨ නීතිඥ කල්‍යානන්ද තිරණගම මහතා විසින් ''19 වැනි ව්‍යවස්ථා සංශෝධනය, ජනතා පරමාධිපත්‍යය සහ සිරිකොත ආධිපත්‍යය'' නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන ලදී.

නමුත් ඔහු විසින් එම ග්‍රන්ථය මගින් ඊනියා ව්‍යවස්ථා සම්පාදකයින්ට එරෙහිව එල්ල කරන ලද චෝදනාවලට සහ ඉන්පසුව සමාජ මාධ්‍ය සහ විද්‍යුත් නාලිකා මගින් තවදුරටත් ඒ පිළිබඳව සිදුකරන ලද පැහැදිලි කිරීම් පිළිබඳව විධිමත්ව උත්තර බැදීමට අදාල චූදිතයින් අසමත් වී ඇත. එවැනි තත්වයක් තුළ විජයදාස රාජපක්ෂ මහතා නැවත වටයකින් අධිකරණ අමාත්‍යවරයා ලෙස සහ රනිල් වික්‍රමසිංහ මහතා ජනවරමක් නැති එහෙත් බලවත් ජනාධිපතිවරයෙකු ලෙස ආරම්භ කර තිබෙන 21 වැනි ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තුළදී කාරක සභා අවස්ථාවේදී බරපතල ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් සිදුවිය හැකි බවට තිරාණගම මහතා විසින් මෙම ග්‍රන්ථය මගින් අනතුරු අඟවා ඇත. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ ව්‍යවස්ථා සංශෝධන නමින් සිදුකර ඇති ව්‍යවස්ථා මගෝඩි පිළිබඳවද ඔහු විසින් විචිත්‍රවත් සහ සාරවත් විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. කාලීන වැදගත්කම සළකා අපි මෙම කුඩා එහෙත් වටිනා ග්‍රන්ථය රටට ආදරය කරන මිනිසුන් වෙත ඉදිරිපත් කරමු.

විධායක සභාව
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය